# 2013

# වාර්ෂික වාර්තාව

EDB

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2015-07-03

ගරු අබ්දුල් රිෂාඩ් බදියුදීන්,

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,

73/1, ගාලු පාර

කොළඹ 03.

ගරු ඇමතිතුමනි,

**<u>වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය - 2013</u>**

1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2013 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සහ පහත සඳහන් ලියකියවිලි ඔබ වෙත සතුටින් පිළිගන්වමි.

- **සභාපතිගේ වාර්තාව**
- **ගිණුම් ප්‍රකාශය**
- **විගණකාධිපතිගේ වාර්තාව**

මෙයට - විශ්වාසී

බන්දුල එගොඩගේ

**සභාපති සහ ප්‍රධාන විධායක**

# <u>ජාතික ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය 2013</u>

| | | |
|---|---|---|
| සභාපති සහ ප්‍රධාන විධායක | - | ජනක රත්නායක මහතා |
| අධ්‍යක්ෂ ජනරාල් | - | ඩබ්. එස්.ඩී. එස්. වීරකෝන් මිය |
| විධායක අධ්‍යක්ෂ | - | ආචාර්ය යුසුෆ් මරික්කාර් මහතා |
| මූල්‍ය අංශය | - | පී. කේ. සුමිත්‍රාරච්චි මිය - අධ්‍යක්ෂිකා |
| මානව සම්පත් කළමනාකරණ අංශය | - | එස්. බී. එම්.ජී. චන්ද්‍රකුමාර මහතා<br>වැ.බ. අධ්‍යක්ෂ (2013.10.31 දක්වා) |
| වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු අංශය | - | එම්. කේ. උදයපාල මහතා<br>අධ්‍යක්ෂ (2013.06.08 දක්වා)<br>එස්. ආර්. බී. එන්. පියසිරි මහතා<br>අධ්‍යක්ෂ (2013.06.18 සිට) |
| තොරතුරු තාක්ෂණ අංශය | - | එම්. බැද්දේගම මිය - වැ. බ. අධ්‍යක්ෂිකා |
| කෘෂි අපනයන අංශය | - | ආචාර්ය එම්. එල්. සමරප්පුලි මිය - අධ්‍යක්ෂිකා |
| අපනයන අලෙවි සංවර්ධන අංශය | - | ජේ. සිරිවර්ධන මිය මිය - අධ්‍යක්ෂිකා |
| සුළු හා මධ්‍යම ව්‍යවසාය සංවර්ධන අංශය | - | ආර්.එම්.පී. හේවාලියනගේ මෙය - අධ්‍යක්ෂිකා |
| ප්‍රතිපත්ති හා සැලසුම් අංශය | - | ඩී. වැගපිටිය මිය - වැ.බ. අධ්‍යක්ෂිකා |
| කාර්මික නිෂ්පාදන අංශය | - | සී. දිසානායක මිය - අධ්‍යක්ෂිකා |
| අපනයන සේවා අංශය | - | එම්. කේ. එස්. කේ. මල්දෙනිය මහතා - අධ්‍යක්ෂ |
| විශේෂ ව්‍යාපෘති අංශය | - | එම්. කේ. එන්. අබේධීර මහතා<br>ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| නීති අංශය | - | ඩී. ටී. විජයරත්න - නීති නිලධාරිනී |
| විගණකවරු | - | විගණකාධිපති |
| බැංකු කරුවන් | - | ලංකා බැංකුව<br>සම්පත් බැංකුව<br>ජාතික සංවර්ධන බැංකුව |

<u>ලියාපදිංචි කාර්යාලය</u>

අංක 42, නවම් මාවත,
කොළඹ 02

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් - 2013

| | | |
|---|---|---|
| 01. ජනක රත්නායක මහතා | - | සභාපති |
| 02. යූසුෆ් මරික්කාර් මහතා | - | අධ්‍යක්ෂ |
| 03. නවාස් රාජබ්දීන් මහතා | - | අධ්‍යක්ෂ |
| 04. ෂරාෆ් එම්.සුහයිබ් මහතා | - | අධ්‍යක්ෂ |
| 05. සුමිත් විජේසිංහ මහතා | - | අධ්‍යක්ෂ |
| 06. කේ.ජී.අලව්දීන් මහතා | - | අධ්‍යක්ෂ |
| 07. රොහාන්ත එන්.ඒ.අතුකෝරාල මහතා | - | අධ්‍යක්ෂ |
| 08. සී.සී.වයි.අබේවර්ධන මහතා | - | අධ්‍යක්ෂ<br>(2013 ජුනි සිට) |
| 09. එස්.අලම්දීන් මහතා | - | අධ්‍යක්ෂ<br>(2013 දෙසැම්බර් සිට) |
| 10. අනුරාධ විජේකෝන් මහතා | - | අතිරේක ලේකම්<br>වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය |
| 11. ඒ.කේ.සෙනෙවිරත්න මහතා | - | අතිරේක ලේකම්<br>කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය |
| 12. එම්.එච්.මුනියුදීන් මහතා | - | අතිරේක ලේකම්<br>කෘෂිකර්ම අමාත්‍යාංශය<br>(2013 අප්‍රේල් සිට) |
| 13. අසෝක සිරිවර්ධන මහතා | - | අතිරේක ලේකම්<br>කෘෂිකර්ම අමාත්‍යාංශය<br>(2013 නොවැම්බර් සිට) |
| 14. පී.එල්.යූ.දිසානායක මහතා | - | අතිරේක ලේකම්<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br>(2013 අප්‍රේල් සිට) |
| 15. යූ.කේ.එස්.මිහිඳුකුලසූරිය මහතා | - | අතිරේක ලේකම්<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br>(2013 දෙසැම්බර් සිට) |
| 16. ඒ.දමිතා එන්. ද සොයිසා මෙනවිය | - | ලේකම්<br>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය<br>(2013 පෙබරවාරි සිට) |

| | | |
|---|---|---|
| 17. ඩී.එම්.ආර්.දිසානායක මහතා | - | ලේකම්<br>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය<br>(2013 පෙබරවාරි සිට) |
| 18. නෙවිල් ගුණවර්ධන මහතා | - | අධ්‍යක්ෂ ජනරාල්<br>වෙළඳ තීරුබදු සහ ආයෝජන ප්‍රතිපත්ති සම්පාදකදෙපාර්තමේන්තුව.<br>මූල්‍ය සහ ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය.<br>(2013 ජූලි සිට) |
| 19. කේ.එම්.එම්.සිරිවර්ධන මහතා | - | අධ්‍යක්ෂ ජනරාල්<br>රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>මූල්‍ය සහ ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය.<br>(2013ඔක්තෝබර් සිට) |
| 20. අයි.අන්සාර් මහතා | - | අතිරේක ලේකම්<br>විදේශ කටයුතු අමාත්‍යාංශය<br>(2013 ජූලි සිට) |
| 21. වී.සිවඥානසෝති මහතා | - | ලේකම්<br>සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය. |
| 22. සංජීව වික්‍රමනායක මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය. |

# පටුන


| | | |
|---|---|---|
| 01 | හැඳින්වීම | 11 |
| 02 | 2013 වර්ෂයේ අපනයන කාර්යය සාධනය | 11 - 34 |
| 03 | 2013.12.31 දිනට ශේෂ පත්‍රය | 35 |
| 04 | 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය | 36 |
| 05 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 37 - 38 |
| 06 | හිමිකම් ප්‍රකාශය | 39 |
| 07 | මූල්‍ය ප්‍රකාශණ සටහන් | 40 - 46 |
| 08 | විගණන වාර්තාව | 47 - 60 |

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනයේ නියැලී ප්‍රධානතම රාජ්‍ය ආයතනයයි.

### අපගේ ඉදිරි දැක්ම

අපගේ ප්‍රධාන අපනයන භාණ්ඩ හා සේවාවන් සඳහා අන්තර්ජාතික ගැණුම්කරුවන් අතර ප්‍රමුඛතම සැපයුම්කරු බවට ශ්‍රී ලංකාව පත් කිරීම.

### අපගේ මෙහෙවර

භාණ්ඩ හා සේවා අපනයනය සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය බවට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පත් කිරීම, ශ්‍රී ලංකාවේ අපනයනයන්ගේ ජාත්‍යන්තර තරගකාරීත්වය ඉහළ නැංවීම, භාණ්ඩ හා සේවා අපනයනයෙන් උපරිම විදේශ විනිමයක් උපයා ගැනීමට කටයුතු කිරීම සහ රජයේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට උපරිමව දායක වීම.

### අපගේ අරමුණු

1. "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" අපේක්ෂිත ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ශ්‍රී ලංකාවේ අපනයන ආදායම වර්ෂ 2020 දී ඇ.ඩොලර් බිලියන 20 දක්වා ඉහළ නැංවීම.

2. යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපද වෙළඳපලවලට කරනු ලබන ශ්‍රී ලංකාවේ අපනයන ස්ථාවරව පවත්වා ගන්නා අතරතුර, අනිකුත් විදේශ වෙළඳපලවලට කරනු ලබන අපනයන, සමස්ත අපනයන ඉපැයුමෙන් 50% ට වඩා වැඩි මට්ටමකට ඉහළ නැංවීම.

3. ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමට 80% ක් පමණ දායක කරනු ලබන හඳුනාගත් ප්‍රමුඛ භාණ්ඩ හත (07) පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්, ඒවායේ අපනයන ආදායම සැලකිය යුතු ලෙස වැඩි කිරීම.

4. ඒකාබද්ධ අලෙවි සන්නිවේදන වැඩ සටහනක් තුලින්, ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ හා සේවා පිළිබඳව ධනාත්මක ප්‍රතිරූපයක් අන්තර්ජාතිකව ඇති කිරීම.

5. අපනයන වෙළඳාමේ ප්‍රතිලාභ, එම ක්ෂේත්‍රයේ නියැලී සියලු පාර්ශවයන්ටම සහ දිවයිනේ සෑම පළාතකටම ගලා යාමට සැලැස්වීම.

6. සේවක ඵලදායිතාව සහ කැපවීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, ආයතනයේ මූලික වටිනාකම් මත ගොනු වූ විශිෂ්ට කණ්ඩායමක් මණ්ඩලය තුළ බිහි කිරීම.

## 01) හැඳින්වීම


ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ ප්‍රවර්ධනයේ නියැළි ප්‍රධානතම රාජ්‍ය ආයතනය වන අපනයන සංවර්ධන මණ්ඩලය, තම වගකීම් ඉටු කිරීමේ කාර්යභාරය සහ විෂය පථය පැහැදිලිව හඳුනාගෙන ඇත. ඒ අනුව ප්‍රතිපත්ති උපදේශක, පසු විපරම්කරු ප්‍රවර්ධන සහායක සහ දැනුම ලබා දෙන්නා යනුවෙන් ප්‍රධාන භූමිකා 5 ක් යටතේ මණ්ඩලය අපනයන ක්ෂෙත්‍රයේ කටයුතු වල නියැලේ.

වසර ගණනක් පුරා, අපනයන සංවර්ධන මණ්ඩලය තම සුවිශේෂී ශක්තීන් සහ හැකියාවන් වර්ධනය කර ගන්නා ලදී. දශක තුනක් පුරාවට ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂෙත්‍රයේ සංවර්ධනයෙ අධිකාරිත්වය දරු අපනයන සංවර්ධන මණ්ඩලය සතුව පැහැදිලිව විධායක බලයක් පවතින අතර එමගින් ආයතනයට ශක්තිමත් ස්ථාවරත්වයක් ලැබී ඇත. තම පාර්ශවකරුවන් සමඟ එක්ව කටයුතු කරමින් යාවත්කාලීන දැක්මකින් සහ උපායමාර්ගයන්ගෙන්ද පරිපූර්ණය.

ව්‍යාපාරික ප්‍රජාවගේ ඉහළ මට්ටමේ ගෞරවයට පාත්‍ර වී ඇති අපනයන සංවර්ධන මණ්ඩලය, තම උපායමාර්ගයන් ක්‍රියාත්මක කිරීමෙදී සහ අධීක්ෂණය කිරීමේදී පෞද්ගලික අංශයේ ප්‍රමුඛයන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය මගින් තම දුරටත් ශක්තිමත් වේ.

පුළුල් උපදේශක ක්‍රියාවලියන්ගේ අනුග්‍රහයෙන් උපාය මාර්ගික අරමුණු සහ ක්‍රියාවන් ක්‍රමවත්ව දැක්විය හැකි අතර එමගින් ජාතික ආර්ථික අවශ්‍යතා, ගෝලීය ආර්ථික සහ ව්‍යාපාරික තත්වයන් මෙන්ම පාර්ශවකරුවන් සහ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් විය හැක.


## 02) ජනවාරි සිට දෙසැම්බර් කාලය තුල අපනයන ක්ෂේත්‍රයේ ප්‍රගතිය




මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

2013 වසරේ දී ශ්‍රී ලංකාවේ අපනයන ආදායම ඇ.ඩො.මිලියන 9,774 ක් වූ අතර එය පසුගිය 2012 වසර අපනයන ආදායම වූ ඇ.ඩො.මි 9,774 හා සසඳන විට 6.27% ක වර්ධනයක් දක්නට ලැබේ.

## මාසික අපනයන ප්‍රගතිය 2011 – 2013




| | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2011 | 903 | 882 | 921 | 759 | 833 | 820 | 962 | 951 | 853 | 890 | 879 | 906 |
| 2012 | 888.2 | 821 | 861 | 748.7 | 806 | 755.8 | 794.4 | 828.9 | 801.5 | 770.4 | 827.6 | 871.1 |
| 2013 | 728.7 | 797.5 | 837 | 696.6 | 793.9 | 807.4 | 857.8 | 918.1 | 890.3 | 1041 | 1032 | 986.1 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

### අපනයන සංවර්ධන මණ්ඩලය මගින් යොදාගන්නා ලද උපාය මාර්ග

2010 සහ 2011 වසර තුල සීඝ්‍ර වර්ධනයනක් පෙන්වූ ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂෙත්‍රය, 2012 වසරේදී ගෝලීය වෙළඳපලේ පවත්නා ඉල්ලුම් සීමාවන් සහ අභ්‍යන්තර සැපයුම් බාධාවන් නිසාවෙන් අපනයන ආදායමේ අඩුවීමක් වාර්තා කරන ලදී.

අපනයන ක්ෂෙත්‍රයේ පසුබෑම වාර්තා වීමෙන් අනතුරුව අපනයන සංවර්ධන මණ්ඩලය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා එක්ව ප්‍රධාන අපනයන කරුවන්ගේඅදහස් විමසීමේ හමුවන් සංවිධානය කරන ලදී.

ගෝලීය ආර්ථික පසුබෑමෙන් ඇතිවන අභියෝගතා වලට අපනයනකරුවන් මුහුණ දීමේදී ඇතිවන ගැටළු සාකච්ඡා කිරීම සහ අපනයන ක්ෂෙත්‍රය වර්ධනයන කිරීම සඳහා සුදුසු උපායමාර්ගයන් සකස් කිරීමේ අරමුණින් මෙම හමුවන් පවත්වන ලදී. මෙහිදී පාර්ශව කරුවන්ගෙන් ලැබුණු තොරතුරු ආශ්‍රයෙන් අපනයන සංවර්ධණ මණ්ඩලය, අපනයන ක්ෂෙත්‍රයට බාධා ගෙන දෙන මහා පරිමාණ ගැටළු සහ නිෂ්පාදන ක්ෂෙත්‍රයන්ගේ ගැටළු ඇතුලත් ගොනුවක් පිළියෙල කරන ලදී.

එමෙන්ම අපනයන ක්ෂෙත්‍රයේ වර්තමාන තත්වය , අපනයනයේ රටාවන් ගැටළු සහ අපනයන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා යෝජිත උපායමාර්ගයන් විශ්ලේෂණය කරමින් වාර්තාවන්ද අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සකස් කරන ලදී.

සකස් කරන ලද සියළුම වාර්තා මෙම ආර්ථික තත්වයට මුහුණ දීම සඳහා ක්‍රියාකාරි සැලැස්ම යාවත්කාලීන කිරීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයන සංවර්ධන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලයට, ගරු ආර්ථික කටයුතු ඇමතිතුමාට, ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමාට සහ ගරු ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය තුමාට ප්‍රධානය කරන ලදී.

**උපදේශක සභා පිහිටුවීම**

1279 අංක 40 දරණ අපනයන සංවර්ධන පනත යටතේ උපදේශක සභා 26 ක් පිහිටුවනු ලැබූ අතර 2013 ජූනි 11 වන දින, නො: 1814/14 අංක දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කරන ලදී.

2013 ජූලි 10 වන දින ගරු රිෂාඩ් බදියුදීන්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින් ප්‍රධාන අපනයන ක්ෂෙත්‍රයන් සහ අනෙකුත් අපනයන ආශ්‍රිත ක්ෂෙත්‍රයන් ආවරණය වන පරිදි පිහිටුවනු ලැබූ උපදේශක සභා සාමාජිකයන්ට පත්වීමේ ලිපි ප්‍රදානය කරනු ලැබීය. මෙයට සමගාමීව “එක්ස්පෝ 2014” අන්තර්ජාතික ප්‍රදර්ශනය නිල වශයෙන් මෘදුකාංග ඇසුරින් දියත් කරන ලදී. මෙයට අමතරව පොදු රාජ්‍ය මණ්ඩලීය නායකයන්ගේ හමුව ඉලක්ක කොටගෙන සංවිධානය කිරීමට නියමිත වෙළඳ ප්‍රදර්ශනයක් පිළිබඳවද නිවේදනය කරන ලදී.

මෙම ප්‍රදර්ශනයේ ශ්‍රී ලාංකිය අරමුණ අපනයනකරුවන් 200-300 කගේතත්වයෙන් උසස් නිෂ්පාදන සහ සේවා එකම වේදිකාවක් තුලදී සියළුම පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල නායකයින් හා වෙළඳ නියෝජිතයන්ට නැරඹීමට සැලැස්වීමයි. මෙහිදී අපනයන සංවර්ධන මණ්ඩලය , මෙම ප්‍රදර්ශනය සංවිධානය කිරීම සඳහා උපදේශක සභාවන්ගේ නියෝජිතයනගේ අනුග්‍රහය අයැද සිටින ලදී.

## 03) වෙළඳපල සංවර්ධන වැඩසටහන්

ශ්‍රී ලාංකිය අපනයන වලින් 50%කට ආසන්න ප්‍රමාණයක් ඇදී යන්නේ යුරෝපා කලාපයට සහ ඇමරිකා එක්සත් ජනපදයට වේ.

වෙළඳපල කිහිපයක් මත රැදියාම නිසා එම වෙළඳපලවල ආර්ථිකයේ වෙනස්වීම අප අපනයන ක්ෂෙත්‍රය කෙරෙහිද බලපානු ලබයි. මෙයට ප්‍රතිවිරෝධය දක්වමින් ආසියානු කලාපය, ලෝකයේ වර්ධනයේ මධ්‍යස්ථානය බවට පත්වෙමින් සිටී. 2013 දී ආසියානු කලාපයේ ප්‍රධාන වෙළඳපල වන ඉන්දියාව සහ චීනය 6%කින් වර්ධනය වීමට අපේක්ෂිතය. ඒ නිසා මෙම වෙළඳපල වලට අපනයනය කිරීමේ හැකියාව වැඩිවීමත් මෙම අනෙකුත් රටවලට අපනයනය කිරීමේ හැකියාව වැඩිවනු ඇත.

දැනට අපගේ අපනයන වෙළඳපල වලට යවනු ලබන අපනයන ප්‍රමාණය එලෙසම තබා ගැනීම සහ නව වෙළඳපලවල් හඳුනා ගනිමින් ඒවාට අපනයනය කිරීමෙන් අපනයන ආදායම වැඩි කළ යුතුය.

නව වෙළඳ උපාය මාර්ගයක් ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය BRICS කලාපයට අපනයනයන් වැඩි කිරීමට කටයුතු කරමින් සිටී. එමෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය අප්‍රිකානු හා CIS කලාපයේ රටවල ද වෙළඳපොල ගවේෂණය කරමින් සිටී. මීට අමතරව යුරෝපා කලාපයේ ප්‍රධාන රටවල් කිහිපයකට පමණක් තිබූ සැලකිල්ල තුර්කියට ද යොමු කළ යුතු වේ.

නිෂ්පාදන සහ වෙළඳපල විවිධාංගිකරණය සහ අපනයන ක්ෂෙත්‍රයේ තරඟකාරිත්වය වැඩි කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම මෙන්ම නිෂ්පාදන සන්නාම්කරණය සඳහා විශේෂ අවධානය ලක් කළ යුතුයි.

## වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන්

ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවාවන්, දැනට පවත්නා, නව සහ නැගී එන අරමුණින්, අදාල කාලය තුල අපනයන සංවර්ධන මණ්ඩලය පහත දැක්වෙන වෙළඳපල ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.

පළමු ඇමිණුම මගින් අදාල කාලය තුල අපනයන සංවර්ධන මණ්ඩලය ක්‍රියාත්මක කළ වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන් සවිස්තරාත්මකව දැක්වේ.

අදාල කාලය තුල පහත වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය සංවිධානය කරන ලදී.

**යුරෝපා කලාපය:**

1. යුරෝපා මුහුදු ආහාර වෙළඳ ප්‍රදර්ශනය (European Sea Food Exposition (ESE) - අපනයනකරුවන් 06
2. අයි පී එම් එසන් ෆෙයා 2013 (IPM Essen Fair 2013) - අපනයනකරුවන් 04
3. (BIOFACH) බයෝ ෆැක් 2013 - අපනයනකරුවන් 03
4. පේපර් වර්ල්ඩ් 2013 (Paper world) - අපනයනකරුවන් 07
5. නෙදර්ලන්තයේ CEBIT 2013 - අපනයනකරුවන් 05
6. ලන්ඩන් පොත් ප්‍රදර්ශනය 2013 - අපනයනකරුවන් 07
7. නෙදර්ලන්තයේ, ජාතින් සන්නම්කරන අන්තර්ජාතික ප්‍රදර්ශනය(Nation Branding International Export) - අපනයනකරුවන් 04
8. එක්සත් රාජධානියේඅන්තර්ජාතික Food & drink Event - අපනයනකරුවන් 05
9. ජර්මනියේ අනුගා අන්තර්ජාතික වෙළෙඳ ප්‍රදර්ශනය - අපනයනකරුවන් 15

**ඇමරිකානු කලාපය**

1. SIAL කැනඩා වෙළඳ ප්‍රදර්ශනය සහ සකස්කළ ආහාරපාන නිෂ්පාදනයන් දැනුම ලබාගැනීමේ වැඩසටහන - අපනයනකරුවන් 07
2. ඇමරිකා එක්සත් ජනපදයේ චිකාගෝ හි IFT 2013 - අපනයනකරුවන් 08
3. ඇමරිකා එක්සත් ජනපදයේ සැන් ෆ්‍රැන්සිස්කෝ හි IFEAT 2013 - අපනයනකරුවන් 08
4. ඇමරිකා එක්සත් ජනපදයේ ලාස් වේගාස් හි Sourcing at Magic අන්තර්ජාතික මෝස්තර වෙළෙඳ ප්‍රදර්ශනය - අපනයනකරුවන් 09

**ආසියානු කලාපය**

1. ඇක්වාරාමා අන්තර්ජාතික මත්ස්‍ය තරඟය සහ දැනුම ලබාගැනීමේ චාරිකාව - අපනයන කරුවන් 17
2. ඉන්දියා රබර් Expo 2013 - අපනයනකරුවන් 06
3. හොං කොං හි House ware Show 2013 - අපනයනකරුවන් 06
4. ඩුබායි හි තාක්ෂණික සහ වෙළඳපල දැනුවත් වීමේ වැඩ සටහන - අපනයනකරුවන් 07
5. චීනයේ දී පාවහන් හා සම්භාණ්ඩ පිළිබඳ තාක්ෂණය ලබා ගැනීමේ වැඩසටහන - අපනයනකරුවන් 10
6. චීනෙය් Chinaplas 2013 - අපනයනකරුවන් 08
7. අපනයන සේවා ක්ෂෙත්‍රය සඳහා චීනයේ බීජිංහි අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනයට වෙළඳ ධූත කණ්ඩායමක් සහභාගි කරවීම - අපනයනකරුවන් 07
8. ඉන්දියාවේ SOLO වැඩසටහන - අපනයනකරුවන් 15
9. ජපානයේ Foodex 2013 - අපනයනකරුවන් 04
10. චීනයේ කුන්මින් හි පළමු චීන දකුණු ආසියා වෙළඳ ප්‍රදර්ශනය (SACTF) - අපනයනකරුවන් 114
11. ජපානයේ IFEX වෙළඳ ප්‍රදර්ශනය - අපනයනකරුවන් 06

- **මැද පෙරදිග කලාපය**

1. එක්සත් අරාබි එමීරයේ Gulfood 2013 - අපනයනකරුවන් 15
2. දකුණු අප්‍රිකාවේ SAITEX 2013 - අපනයනකරුවන් 06

අපනයන සංවර්ධන මණ්ඩලය වෙළඳපල කිහිපයක් මත රැඳියාව අඩු කිරීමට ශ්‍රී ලාංකීය අපනයන විවිධාංගීකරණය කිරීමේ අරමුණින් අදාල කාලය තුල වෙළඳපල පර්යේෂණයන් දෙකක් සිදු කරන ලදී.

1. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා නව ගමනාන්තයක් වන බ්‍රසීලියානු ආර්ථිකය.
2. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා දකුණු අප්‍රිකානු වෙළඳපලේ අවස්ථා

"බ්‍රසීලියානු ආර්ථිකය" පිළිබඳ වාර්තාව, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාට, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශ ලේකම්තුමාට, අදාල තානාපති කාර්යාල සහ වාණිජ දෙපාර්තමේන්තුවට යොමු කළ අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් අනතුරුව අනෙක් වාර්තාවද අදාල ආයතන වලට යොමු කිරීමට නියමිතය.

## 04). ප්‍රධාන වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන්

**තුර්කියේ 82 වන ඉස්මීර් අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනයේශ්‍රී ලංකාව වැජඹේ.**

2013 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 02 දක්වා තුර්කියේ පැවැති 82 වන ඉස්මීර් අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය, තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා එක්ව ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ගේ සහභාගීත්වය සංවිධානය කරන ලදී.

තුර්කියේ පැරණිතම වෙළඳ ප්‍රදර්ශනයක් වන මෙහි මිතුරු රාජ්‍යයක් ලෙස ක්‍රියා කිරීමට ප්‍රථම වරට ආසියානු රටක් වන ශ්‍රීලංකාවට හැකිවේ. ශ්‍රී ලංකාව වෙළඳ ආයෝජන සහ සංචාරක කර්මාන්තයන් සඳහා විශ්වාසනිය දිවයිනක් ලෙස ප්‍රවර්ධනය කිරීම මෙහි ශ්‍රී ලාංකීය සහභාගිත්වයෙන් සිදු කෙරිණි.

අපනයන වර්ධනය තුලින් ජාතික ආර්ථිකය ගොඩ නැගීමේ අරමුණින් මෙම ශ්‍රී ලාංකීය සහභාගිත්වය අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී. මෙහි ප්‍රධාන අරමුණු වූයේ ශ්‍රී ලංකාවේ වෙළඳ ආයෝජන සහ සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය සහ අන්තර්ජාතික ගැණුම්කරුවන් තුළ ශ්‍රී ලාංකීය තත්වයෙන් උසස් භාණ්ඩ සහ සේවා පිළිබඳ විශ්වාසය ගොඩ නැංවීමත්ය.

ප්‍රදර්ශනයට සමගාමීව ශ්‍රී ලංකා නියෝජිත පිරිසට ගැම්බියා තානාපති, ලිබියානු අමාත්‍ය ධූත මණ්ඩලය, ඉන්දුනීසියානු වෙළඳ ධූත මණ්ඩලය, තුර්කියේ ඉස්මීර් සහ සිනොප් නගරයේ රජයේ ආණ්ඩුකාරවරයා සමඟ සාකච්ඡා කිරීමේ අවස්ථාව ලැබිණ. එමෙන්ම තුර්කියේ ප්‍රධාන ව්‍යාපාරිකයන් සමඟ වෙළඳ හමුවන්ට සහභාගී වීමටද ශ්‍රී ලාංකීය නියෝජිත පිරිසට හැකි විය.

ශ්‍රී ලාංකීය අපනයනකරුවන් තත්වයෙන් උසස් නිෂ්පාදන රාශියක් ප්‍රදර්ශනය කරන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලය මෙම ප්‍රදර්ශනයට සහභාගී කරවූ අපනයන කරුවන්ගේ ප්‍රගතිය එනම් ඔවුන් ලැබූ වෙළඳ ඇණවුම් ආදිය ඇගැයීමට ලක්කිරීමට බලාපොරොත්තුවේ. 2013 අගෝස්තු 29 වන දින පැවති ප්‍රදර්ශනයේ සමාරම්භක උළෙලට සහභාගි වූ ගරු රිෂාඩ් බදියුදීන්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා රැස්ව සිටි පිරිස අමතා දේශනයක් පවත්වන ලදී. ගරු හිසාර් මුස්තාෆා, සංචාරක කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාද මේ අවස්ථාවට සහභාගි විය.

ශ්‍රී ලාංකීය සහභාගිත්වය අතිශයින් සාර්ථක වූ අතර එමගින් විදේශිය ගැණුම්කරුවන්ට ආකර්ශනීය සහ සීඝ්‍රයෙන් වර්ධනය වන ශ්‍රී ලාංකීය වෙළඳපලෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ ප්‍රදර්ශනය කළ හැකි විය.

අපනයන සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය සහ තරගකාරිත්වය නිර්මාණය කිරීම සඳහා කැප වී සිටින අතර අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශන මගින් ශ්‍රී ලංකාව පිළිබඳ ලොවට ගෙන යාමද සිදු කරයි.

**දකුණු ආසියානු වෙළඳ ප්‍රදර්ශනය**

අපනයන සංවර්ධන මණ්ඩලය චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා එක්ව ප්‍රථම වරට චීනයේ කුන්මින් හි දකුණු ආසියානු වෙළඳ ප්‍රදර්ශනය සඳහා වෙළඳ කුටි 130 කින් සමන්විත ශ්‍රී ලාංකීය සහභාගීත්වය සංවිධානය කරන ලද අතර එමගින් සාර්ථක ව්‍යාපාරික ප්‍රතිපල අත්කර ගත හැකි විය.

දකුණු ආසියානු රටවලින් චීනයට සිදු කරන ආනයන වැඩි කිරීමේ අරමුණින් චීනයේ වාණිජ අමාත්‍යාංශය සහ යනාන් ප්‍රාන්ත රජය එක්ව මෙම ප්‍රදර්ශනය සංවිධානය කරනු ලැබේ. මෙවර ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩලය තුල මැණික් සහ ආභරණ කුටි 77ක්, තේ 12ක්, අත්කම් 15ක්, කොහු ආශ්‍රිත නිෂ්පාදන 03ක්, රබර් සහ ප්ලාස්ටික් 02ක්, ආයුර්වේද නිෂ්පාදන 01ක් සහ සංචාරණය 03ක් යනාදි වශයෙන් වෙළඳ කුටි තුල ශ්‍රී ලාංකීය නිෂ්පාදන ප්‍රදර්ශනය කෙරිණ.

මැණික් සහ ආභරණ, තේ, අත්කම් සහ කොහු ආශ්‍රිත නිෂ්පාදන වැඩිම ප්‍රගතියක් අත්කරගත් ක්ෂේත්‍ර වූ අතර මෙවර ප්‍රදර්ශනය තුලින් ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට ඇ.ඩො. මිලියන 1.3ක වෙළඳ ඇනවුම් ලැබී තිබිණ.

මීට අමතරව ප්‍රදර්ශනයට සමගාමීව පැවැති 21 වන චීන දකුණු ආසියානු වෙළඳ සමුළුවට සහභාගි වීමේ අවස්ථාවක් ලැබිණ.

ගරු දී.මු. ජයරත්න අග්‍රාමාත්‍ය තුමා, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමා සහ අපනයන සංවර්ධන මණ්ඩලය නිලධාරින්, යුනාන් ප්‍රාන්තයේ වැඩ බලන ආණ්ඩුකාරවරයා, අන්තර්ජාතික වෙළඳාම ප්‍රවර්ධනය කිරීමේ චීන කවුන්සිලය සහ යුනාන් ප්‍රාන්තයේ නිරෝධානය දෙපාර්තමේන්තුව සමඟ දෙරටේ ආර්ථික සංවර්ධනය වර්ධනය කිරීමේ අරමුණින් සාකච්ඡාවන් පවත්වන ලදි.

එමෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් චීනයේ විශාලතම පරිසර හිතකාමී එළවළු සහ පළතුරු නිෂ්පාදන සමාගමක් වන Chennong සමාගමේ කළමණාකාරිත්වය සමඟ සාකච්ඡා කිරීමේ අවස්ථාවක් ශ්‍රී ලාංකීය පරිසර හිතකාමී කොහු ආශ්‍රිත බඳුන් නිෂ්පාදිත අපනයනකරුවෙකුට ලබාදෙන ලදී.

**ඇක්වාරාමා 2013 අන්තර්ජාතික මත්ස්‍ය තරඟය - ශ්‍රී ලාංකීය අපනයනකරුවන් සඳහා සම්මාන 30 ක්.**

අපනයන සංවර්ධන මණ්ඩලය, සිංගප්පූරුවේ පැවැති අන්තර්ජාතික මත්ස්‍ය ප්‍රදර්ශනය සඳහා අපනයන කරුවන් 17කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කරන ලදී.

ශ්‍රී ලාංකීය මත්ස්‍ය අභිජනකයින් මෙම ලොව විශාලතම විසිතුරු මත්ස්‍ය තරඟයේදී සම්මාන 30 ක් දිනා ගන්නා ලදී. විශේෂයෙන්ම ප්‍රථම වරට ගෝල්ඩ්ෆිශ්, ගුරාමි සහ ජලජ පැළැටි ටැංකිය ශ්‍රී ලංකාවට සම්මාන හිමි විය.

මින් දෙදෙනෙක්ම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කෘෂි කලාප ව්‍යාපෘතිය යටතේ පිහිටුවනු ලැබූ පොලොන්නරුව විසිතුරු මත්ස්‍ය ව්‍යාපෘතියේ සාමාජිකයන් වේ.

මෙරට තුල ගැණුම්කරු - විකුණුම්කරු හමු

- 2013 අගෝස්තු මස BMICH හි පැවැති Profood වෙළඳ ප්‍රදර්ශනය හා සමගාමීව එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් ගැණුම්කරු නියෝජනයක් ගෙන්වීමට වොක්රාම්, ලූලා, අල් මායා ආදි ප්‍රසිද්ධ සුපිරි වෙළඳසැල් වලින් ගැණුම්කරුවන් 06ක් ගෙන්වීම, ඔවුන් සඳහා කර්මාන්ත ශාලාවන්ට චාරිකා සංවිධානය කිරීම.
- 2013 අන්තර්ජාතික මැණික් සහ ආභරණ ප්‍රදර්ශනය FACETS සඳහා රුසියාව, චීනය සහ ඇමරිකා එක්සත් ජනපදයෙන් ගැණුම්කරුවන් ගෙන්වීම.
- 2013 පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා පෝලන්තය, ජෝර්දානය, දකුණු අප්‍රිකාව සහ ඉන්දියාවෙන් ගැණුම්කරුවන් ගෙන්වීම.
- 2013 සැප්තැම්බර් 04 වන දින නෙදර්ලන්තයෙන් වෙළඳ දූත කණ්ඩායමක් - 15 දෙනෙකුගෙන් යුතු වෙළඳ නියෝජිත කණ්ඩායම සඳහා වෙළඳ සමුළුවක් සහ B2B හමුවක් සංවිධානය කරන ලදී.
- තේ, ආයුර්වේද සහ සෙරමික් ක්ෂේත්‍ර සඳහා ව්‍යාපාරික වෙළඳ සබඳතා ගොඩ නගා ගැනීමේ හැකියාවන් ගවේෂණය කිරීමට 2013 පෙබරවාරි 08 සිට 10 දක්වා පෝලන්තයෙන් ගැණුම්කරුවන් තිදෙනෙක්ගේපැමිණීම සංවිධානය කරන ලදී.
- නව දිල්ලියෙහි පිහිටි බෙලරුසියා තානාපති කාර්යාලය මගින් නියෝජිතයන් 10කගෙන් යුත් වෙළඳ දූත පිරිසක් ශ්‍රී ලංකාවට එවන ලද අතර අපනයන සංවර්ධන මණ්ඩලය ව්‍යාපාරිකයන් 40ක් සමඟ ව්‍යාපාරික හමුවන් සංවිධානය කරන ලදී.
- 2013 ජූලි මස පැවති "ආයුර්වේද එක්ස්පෝ" ප්‍රදර්ශනය හා සමගාමීව ආයුර්වේද හා ස්පා නිෂ්පාදන පිළිබඳ ව්‍යාපාරික සබඳතා ගොඩ නගා ගැනීමට දකුණු අප්‍රිකාවෙන් සාමාජිකයන් 03 දෙනෙකුගෙන් යුතු වෙළඳ දූත පිරිසකගේ ආගමනය සංවිධානය කරන ලදී. ව්‍යාපාරික හමුවන් 05ක් සහ කර්මාන්තශාලාවන් සඳහා චාරිකා 02ක් සංවිධානය කරන ලදී.
- 2013 අගෝස්තු 26 සිට 31 දක්වා ඊශ්‍රායලයෙන් 25 දෙනෙකුගෙන් සමන්විත වෙළඳ දූත පිරිසකගේ ආගමනය සංවිධානය කරන ලදී.
- ශ්‍රී ලංකාවේ චාරිකාවක් සඳහා පැමිණි ගරු බල්ගේරියාවේ කොන්සාල්තුමා වෙනුවෙන් සෙරමික් සහ පිඟන් භාණ්ඩ, මේස් මෝස්තර, කොහු ආශ්‍රිත නිෂ්පාදන සහ ස්පා නිෂ්පාදන, ඇඟළුම් කර්මාන්ත ශාලා යනාදිය සඳහා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරන ලද අතර රැස්වීම් 10ක් පවත්වන ලදී.
- නෙදර්ලන්තයෙන් පැමිණි වෙළඳ නියෝජිත පිරිස වෙළඳ සමුළුවක් සහ B2B හමුවන් සංවිධානය කරන ලදී.

## 05). කෘෂි කාර්මික නිෂ්පාදන, ධීවර නිෂ්පාදන, කාර්මික නිෂ්පාදන සහ අපනයන සේවා සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්.

2013 ජනවාරි - සැප්තැම්බර් කාලය තුල අපනයන සංවර්ධන මණ්ඩලය කෘෂි කාර්මික නිෂ්පාදන, ධීවර නිෂ්පාදන, කාර්මික නිෂ්පාදන සහ අපනයන සේවා සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය සංක්ෂිප්තව පහත දැක්වේ.

## - ශ්‍රී ලංකා කුරුඳු සන්නාම්කරණය

**ලෝක බුද්ධිමය දේපල කාර්යාලය (WIPO) හා එක්ව පිරිසිදු ශ්‍රී ලංකා කුරුඳු වෙළඳ ලකුණ ලියාපදිංචි කිරීම.**

"Pure Ceylon Cinnamon" අන්තර්ජාතික වෙළඳපලේ ගෝලීය සන්නමනාමයක් ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පිහිටුවන ලැබිය. වෙළඳ ලත් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රධාන වෙළඳපලවල්වල ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා වෙළඳපලවල ලියාපදිංචි කරන ලද අතර ලෝක බුද්ධිමය දේපල කාර්යාලයේ ලියාපදිංචිය සඳහා දැනටමත් ඉල්ලුම් කර ඇත.

ශ්‍රී ලංකා කුරුඳු "පිරිසිදු ශ්‍රී ලංකා කුරුඳු" ලෙසින් සන්නම්කරණය සහ ඉලක්ක වෙළඳපලවල සන්නම්කිරීම තුලින් ශ්‍රී ලංකාවේ කුරුඳු වල ප්‍රධාන ලක්ෂණ ඉස්මතු කිරීමෙන් කැසියා වැනි බාල ආදේශක වලින් කුරුඳු වෙන්කර හඳුනා ගැනීමට සැලැස්වීමෙන් තරඟකාරීත්වයේ වාසිය ශ්‍රී ලංකාවට ලබා ගත හැක.

මේ අනුව අන්තර්ජාතික වෙළඳපලේ සන්නම්කරණය කරන ලද කුරුඳු මගින් සියළුම ආවේණික ලක්ෂණ පිළිඹිබු කරනු ලැබේ.

මෙක්සිකෝ, පීරු සහ කොලොම්බියා වෙළඳපල වලද ශ්‍රී ලංකා කුරුඳු වෙළඳ ලකුණ ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කර තිබේ.

එමෙන්ම අපනයනය කරන කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන සඳහා "පිරිසිදු ශ්‍රී ලංකා කුරුඳු" සන්නම් ලකුණ ලබා දීමට අපේක්ෂිතය.

ශ්‍රී ලංකා කුරුඳු (Ceylon Cinnamon) හි භාරකාරත්වය, කැබිනට් මණ්ඩල අනුමැතියකින් අපනයන සංවර්ධන මණ්ඩලයට ලැබුණු අතර "Sri Lanka Cinnamon" සහ "Sri Lankan" යනාදිය ද භාවිතා කිරීමේ අයිතිය මණ්ඩලය සතු විණ. එමෙන්ම ශ්‍රී ලාංකීය කුරුඳු ආරක්ෂා කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමෙ මගකීම ද මණ්ඩලයට පැවරිණ.

පලමු පියවර යටතේ අපනයන සංවර්ධන මණ්ඩලය භූගෝලීය දර්ශකය (GI) යටතේ කුරුඳු ආරක්ෂා කිරීමට ජාතික බුද්ධිමය දේපල කාර්යාංශය (NIPO) සමග ශ්‍රී ලංකා කුරුඳු ලියාපදිංචි කරමින් සිටී.

එමෙන්ම යුරෝපා මණ්ඩලයට අමතරව අනෙකුත් වෙළඳපලවල ශ්‍රී ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශකය (GI) ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

එමගින් ශ්‍රී ලාංකීය කුරුඳු සඳහා වැඩි ආරක්ෂාවක් ලැබෙන අතර කැසියා කුරුඳු වලින් ආරක්ෂාවක් ද ලැබේ.

**"අපනයනය කරනු ලබන කුරුඳු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර අනිවාර්ය කිරීම" පිළිබඳ සම්මන්ත්‍රණය**

අපනයන සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව කුරුඳු කර්මාන්තයේ නියැලි සිටින්නන්ට අවශ්‍ය වන ප්‍රමිතීන් සහ ආරක්ෂා සුරක්ෂිතතාවය පවත්වා ගැනීමට අවශ්‍ය දැනුම ලබා දීමේ අරමුණින් "අපනයනය කරනු ලබන කුරුඳු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර අනිවාර්ය කිරීම" මැයෙන් සම්මන්ත්‍රණයක් 2013 සැප්තැම්බර් 06 වන දින මණ්ඩලීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

අපනයනය කරනු ලබන කුරුඳු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර අනිවාර්ය කිරීම, 2014 ජනවාරි සිට ක්‍රියාත්මක වන අතර ඒ අනුව මෙම සම්මන්ත්‍රණය මගින් කුරුඳු කර්මාන්තයේ නියැලී සිටින්නන්ට අන්තර්ජාතික වෙළඳපලට පිවිසීමට අවශ්‍යවන ප්‍රමිතීන් සහ කුරුඳු කර්මාන්තයේ ගුණාත්මක බව වැඩිකිරීමට මෙන්ම අපනයන වෙළඳපල අවශ්‍යතාවලට ගැලපෙන පරිදි ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ සැලකිලිමත් වීම සඳහා අනුග්‍රහය ලැබිය.

**අගය වර්ධනය කිරීමේ වැඩසටහන - කුරුඳු තලන්නන්ගේ පුහුණු විද්‍යාලයේ වැඩ කටයුතු සංවිධානය කිරීම.**

2013 ජාතික අයවැය මගින් අපනයන සංවර්ධන මණ්ඩලයට "කුරුඳු තලන්නන් විදිමත්ව පුහුණු කිරීම සඳහා විද්‍යාලයක්" ඇරඹීම සඳහා අනුමැතිය ලැබුණි.

ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ නිෂ්පාදන හැකියාව සහ තරඟකාරිත්වය වැඩි කිරීමේ අරමුණින් UNIDO හා එක්ව කුළු බඩු නිෂ්පාදකයන්ගේ කවුන්සිලය මගින් මෙම අය වැය යෝජනාව ඉදිරිපත් කරන ලදී. කුරුඳු පුහුණු විද්‍යාලය (Cinnomon Training Academy (Pvt.) Ltd (CTA) හි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ගිවිසුම අත්සන් කරන ලදී.

- **විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් සඳහා නිරෝධායන පහසුකම් සහ රඳවා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා සහන ලබා දීමේ වැඩ සටහන.**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2013 ජාතික අයවැය මගින් අනුමත වූ විසිතුරු මත්ස්‍ය ක්ෂෙත්‍රයේනිරෝධායන පහසුකම් සහ රඳවා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා මූල්‍ය සහනයක් ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. අපනයන වෙළඳපල පැවැත්ම සහ වර්ධනය කිරීම සඳහා ආනයනික රටවල විශේෂයෙන් ජීවීන් සඳහා වූ නිරෝධායන සහ සෞඛ්‍යාරක්ෂිත ක්‍රම පිළිබඳ නීති රෙගුලාසි අනුගමනය කළ යුතුය.

ශ්‍රී ලාංකීය ඍජු සහ වක්‍ර විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් බහුතරයකට තවමත් උචිත නිරෝධායන සහ රඳවා ගැනීමේ පහසුකම් නොමැති වීම නිසා අවසාන ගමනාන්තය සඳහා පැමිණීමේදී මසුන් වැඩි ප්‍රමාණයක් මිය යාම සිදුවේ. එනිසා මෙම පහසුකම් ඇතිකිරීමත්, නිරෝධායන ක්‍රියාවලිය අනුගමනය කිරීමත් සමඟම අපනයනකරුවන්ට මත්ස්‍යයින්ගේ යහපත් සෞඛ්‍ය පවත්වා ගත හැකිවනු ඇත. මෙම සහන ලබා දීමේ වැඩ සටහනට තෝරාගත් අපනයනකරුවන්ට රුපියල් මිලියන 1.5 ක උපරිමයකට යටත්ව ඔවුන්ගේ මත්ස්‍ය ගොවිපල සංවර්ධනය සඳහා වැයවූ මුදලින් 50% ක් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. 2013 වසරේදී ව්‍යාපෘති 26ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර ඇත. මෙම වැඩ සටහන පිළිබඳ දැන්වීම් පළකල අතර යෝජනා 29ක් ලැබී ඇත. සුදුස්සන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. පත්කරන ලද ඇගයීම් කමිටුව ව්‍යාපෘති 26ක් සඳහා මූලික චාරිකා සිදුකරන ලද අතර ව්‍යාපෘති 14ක් ඇගැයීමට ලක් කරන ලදී.

**"ශ්‍රී ලංකා නිල් මැණික්" හි ආවේණික බව ඉස්මතු කරමින් ශ්‍රී ලංකා මැණික් සහ ආභරණ ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම.**

අපනයන සංවර්ධණ මණ්ඩලය ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය හා එක්ව ශ්‍රී ලංකාවේ මැණික් සහ ආභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩ පිළිවලෙක් ආරම්භ කරන ලදී.

වසර 2015 දී ඇමරිකානු ඩොලර් බිලියන 1ක අපනයන ඉලක්කයක් ලබා ගැනීම සඳහා විශ්වාසනීය ක්ෂේත්‍රයක් ලෙස මැණික් සහ ආභරණ ක්ෂේත්‍රය, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් හඳුනාගෙන තිබේ. ප්‍රවර්ධන වැඩ පිළිවෙලේ කාර්යයක් ලෙස ඉලෙක්ට්‍රොනික පුවත් පතක් ප්‍රකාශයට පත්කර අන්තරජාලය ඔස්සේ බෙදා හරින ලදී. මෙමගින් අන්තර්ජාතික වෙළඳපලේ පාරිභෝගිකයන් සඳහා තත්වයෙන්ද උසස් මැණික් (සෆායර්) ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව විශ්වාසනීය දිවයිනක් බව ප්‍රචලිත කිරීමට හැකිවනු ඇත. එමෙන්ම ශ්‍රී ලාංකාවේ මැණික් සඳහා ඇති ඉල්ලුම වැඩි කිරීමෙන් , ශ්‍රී ලංකාවේ අපනයනය කරනු ලබන මැණික් ප්‍රමාණය වැඩි කළ හැක.

ශ්‍රී ලංකා මැණික් ප්‍රවර්ධනය සහ මැණික් වෙළෙන්දන්ගේ සහ ආභරණ නිෂ්පාදකයින් ලොවට හඳුන්වා දීම සඳහා දැනට ප්‍රකාශන කිසිවක් නොමැති හෙයින් මෙම විද්‍යුත් පුවත්පත මගින් කර්මාන්තයේ නියෙලෙන්නන්ට විශාල මෙහෙවරක් සිදු කිරීමට හැකිවනු ඇත. ප්‍රවර්ධන වැඩ පිළිවෙලේ ප්‍රධාන අංගයක් ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා මැණික් පිළිබඳ තොරතුරු අන්තර්ජාතික මාධ්‍ය ජාලය හා එක් කිරීමේ අරමුණින් වෙබ් අඩවියක් සකස් කරන ලදී. මෙම වෙබ් අඩවිය ශ්‍රී ලාංකික මැණික් සහ ආභරණ කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා නැවත සකස් කර දියත් කරන ලදී.

**අන්තර්ජාතික මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනය (FACETS ශ්‍රී ලංකා 2013)**

අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ සංගමය සහ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය හා එක්ව 23වන අන්තර්ජාතික මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය (FACETS ශ්‍රී ලංකා 2013) 2013 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 01 දක්වා සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ශාලාවේදී පවත්වන ලදී.

ශ්‍රී ලාංකීය මැණික් සහ ස්වර්ණාභරණ නිෂ්පාදන අන්තර්ජාතික වෙළඳපලට හඳුන්වා දීමේ හා අන්තර්ජාතික වෙළඳපලේ ප්‍රමුඛ මැණික් සහ ස්වර්ණාභරණ සැපයුම්කරුවෙකු බවට ලංකාව පත්කිරීමේ අරමුණින් මෙම ප්‍රදර්ශනය සංවිධානය

මෙවර අපනයන සංවර්ධන මණ්ඩලය, දිවයින පුරා සුළු හා මධ්‍ය පරිමාණ මැණික් සහ ස්වර්ණාභරණ නිෂ්පාදකයින් 18 දෙනෙකුගෙන් යුතු විශේෂ වෙළඳ මණ්ඩලයක් ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය ඉදිරිපත් කිරීමේ අරමුණින් කරන ලදී.

මෙයට අමතරව අපනයන සංවර්ධන මණ්ඩලය චීනයෙන් 11 ක්, රුසියාවෙන් 03ක්සහ ඇමරිකා එක්සත් ජනපදයෙන් දෙදෙනෙක් ඇතුළු වෙළඳ දූත කණ්ඩායමකගේ ආගමනය සංවිධානය කරන ලදී.

**ශ්‍රී ලංකාවේ නොපවතින ශ්‍රී ලාංකීය රබර් නිෂ්පාදන සඳහා අවශ්‍ය තත්ත්ව සහතික ලබා ගැනීමට සහ තත්ත්ව පරීක්ෂණ සිදු කිරීම සඳහා සහන ලබා දීමේ වැඩ සටහන.**

ශ්‍රී ලංකාව SOLEDEAL, CONTINENTANAL, WONDER GRIP, MAPA සහ SAFETY WORK යනාදී ලොව ප්‍රමුඛ අන්තර්ජාතික සන්නාමනාම හිමි රබර් නිෂ්පාදකයන්ට රබර් නිෂ්පාදන සැපයීමේ මූලික රටක් වේ. ප්‍රසිද්ධියට පත් ශ්‍රී ලාංකීය රබර් නිෂ්පාදන වල උසස් තත්වය සහ විශ්වාසනීයත්වය තව දුරටත් රඳවා ගැනීම සඳහා ශ්‍රී ලාංකීය අපනයනකරුවන් ශ්‍රී ලංකාවේ පහසුකම නොමැති වුවද අවශ්‍ය සහතික සහ ප්‍රමිතීන් ලබාගත යුතුය. මෙම ආරක්ෂා විධි සහ අනෙකුත් රෙගුලාසි වලට අනුකූල නොවී ශ්‍රී ලාංකීය රබර් නිෂ්පාදන අලෙවි කරගත නොහැකි තත්වයක් පැනනැගී ඇත.

සමහර පර්යේෂණ/සහතික අඛණ්ඩව සිදු කළ යුතු අතර තවත් සමහර ඒවා ආනයනකරු මත ඔහුගේ අවශ්‍යතාවය මත රඳා පවතී. ශ්‍රී ලංකාවේ නොපවතින බැවින් මෙම පර්යේෂණයන් විදෙස් රටකදී සිදු කිරීමට අති විශාල පිරිවැයක් දැරීමට ශ්‍රී ලාංකීය අපනයන කරුවාට සිදුවේ. නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හේතුවෙන් අන්තර්ජාතික වෙළඳපලේ තරඟකාරිත්වයට මුහුණ දීමට ශ්‍රී ලාංකීය අපනයනකරුවා අපොහොසත් වේ.

රබර් නිෂ්පාදන අපනයනකරුවන්ට සහනයක් ලබා දීමට අපනයන සංවර්ධන මණ්ඩලය මෙම සහන ලබා දීමේ වැඩ සටහන ආරම්භ කරන ලදී.

මෙගින් අන්තර්ජාතික වෙළඳපලේ අගය එකතු කළ රබර් ආශ්‍රිත නිෂ්පාදනයන් හි ඵලදායිතාවය සහ තත්වය වර්ධනය කිරීමට හැකිවනු ඇත

**පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය - 2013**


අපනයන සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමය හා එක්ව පස්වන ශ්‍රී ලංකා පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය, 2013 පෙබරවාරි 08 සිට 10 දක්වා සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. ගරු බැසිල් රාජපක්ෂ, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා සමාරම්භක උළෙලේ ප්‍රධාන ආරාධිතයා විය. මෙම ප්‍රදර්ශනයේ මූලික අරමුණ දේශියව හා ජාත්‍යන්තරව වශයෙන් ශ්‍රී ලාංකීය පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන සඳහා ඉහළ ප්‍රතිරූපයක් ගොඩ නැගීමයි. විශේෂයෙන්ම මෙහිදී සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් සඳහා ද තම නිර්මාණ ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාවක් සලසා දෙන ලදී.

මෙවර ප්‍රදර්ශනය වෙළඳ කුටි 214 කින් සමන්විත වූ අතර පාවහන්, ගමනාගමන ද්‍රව්‍ය, අමු ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ සහ අදාල අනෙකුත් සේවා සහිත ප්‍රදර්ශනය කුටි රාශියක් විය. කර්මාන්තයට අවශ්‍ය උපාංග සහ කොටස් නිෂ්පාදනය කරනු ලබන දේශීය ව්‍යාපාරිකයන්ට ද මෙවර ප්‍රදර්ශනයේදී ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමේ හැකියාව ලබා දෙන ලදී. මෝස්තර දැක්ම සහ හොඳම වෙළඳ කුටිය තේරීමේ තරඟය මෙවර ප්‍රදර්ශනයේ කැපී

පෙනෙන අංග විය. ශ්‍රී ලාංකීය මෝස්තර කරුවන්ගේ හැකියාවන් හඳුනාගැනීම සහ ඇගයීම සඳහා සම්මාන ප්‍රධානෝත්සවයක් පැවැති අතර ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් ජයග්‍රාහකයන්ට සම්මාන පිරිනැමිණ.

**පොදුරාජ්‍ය මණ්ඩලීය නායකයන්ගේ සමුළුව (CHOGM) හා සමගාමීව පැවැත්වීමට නියමිත වෙළඳ, සංචාරක සහ ආයෝජන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා වෙළඳ ප්‍රදර්ශනය.**

**("Reflection of Sri Lanka") - නොවැම්බර් 13 – 17**




අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ සුරතින් 2013 නොවැම්බර් 13 වන දින උත්කර්ශවත් ලෙස ආරම්භ වූ "Reflection of Sri Lanka" වෙළඳ, සංචාරක සහ ආයෝජන ප්‍රදර්ශනය සහ ඊට සමගාමී වැඩ සටහන් සඳහා විදේශීය නියෝජිතයන් ඇතුළුව 242,000 කට අධික පිරිසක් සහභාගී වූහ.

පොදු රාජ්‍ය සමුළුවේ ප්‍රතිලාභ උපරිම කරගැනීමේ අරමුණින් ඊට සමගාමීව පවත්වන ලද මෙම ප්‍රදර්ශනය ආර්ථික කටයුතු අමාත්‍යාංශයත්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයත්, යටතේ පවතින ආයතන වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන රැසක සහභාගීත්වයෙන් සංවිධානය කරන ලදී.අපනයන ආයතන, තාක්ෂණික සේවා දායකයින්, සේවා සපයන්නන්හාසුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ගෙන් සැදුම්ලත් දේශිය හා විදේශිය වෙළඳ කුටි 600කට අධික සංඛ්‍යාවකින් මෙම ප්‍රදර්ශනය සමන්විත විය.

ප්‍රදර්ශනයට සහභාගී වූ පිරිස අතරින් 1428 ක් විදේශීය ගැනුම්කරුවෝ වූහ.ඇෆ්ගනිස්තානය, ආජන්ටිනාව, ඕස්ට්‍රේලියාව, අරුබා, බංගලිදේශය, බෙල්ජියම, බහරේන්, බෘනායි, කැනඩාව,

ස්විට්සර්ලන්තය, චිලී, කැමරූන්, චීනය, ක්‍රිස්මස් දිවයින, චෙක් ජනරජය, ඩුබායි, ජර්මනිය, ඩෙන්මාකය, ඊජිප්තුව, ප්‍රංශය, හොංකොං, හොන්ඩුරාස්, ඊශ්‍රායලය, ඉන්දියාව, ඉරානය, ඉතාලිය, ජෝර්දානය, ජපානය, කෙන්යාව, කාම්බෝජය, උතුරු කොරියාව, දකුණු කොරියාව, කුවේට්, කසකස්තානය සහ ලෙබනනය ඇතුළු රටවල් 66කින් විදේශීය ගැනුම්කරුවෝ සහභාගී වූහ. ඔවුන් ශ්‍රීලංකීය අපනයන කරුවන් සමග ඉතා ඵලදායී සාකච්ඡා රැසකට සහභාගී වූහ.

ඊට අමතරව ජාත්‍යන්තර වෙළදාම ප්‍රවර්ධනය සදහා වන චීන කවුන්සිලය (29), ජාත්‍යන්තර ආර්ථික සහයෝගිතාව පිළිබද චීන සංගමය (14), North City Group සමාගමේ නියෝජිත පිරිස (13), චීන එක්සත් FST ෂී පියැන් නියෝජිත පිරිස (06), ෂොං දොං හී Zi Bo Jiuyi International නියෝජිත පිරිස (02), ඉරානය

(08), එක්සත් අරාබි එමීර් රාජ්‍යය (16), දකුණු අප්‍රිකාව (04) සහ ඉතාලි ගොඩනැගිලි සමාගම (01) යනාදී ජාත්‍යන්තර වෙළඳ නියෝජිත සහභාගීත්වය ද දක්නට ලැබිණි. එමෙන්ම විදේශීය ගැනුම්කරුවන් හා දේශීය අපනයන කරුවන් අතර B2B හමුවීම් 101 ක් පමණ පවත්වනු ලැබිය.

මෙහිදී ප්‍රදර්ශනයට සහභාගී වූ විදේශීය ගැනුම්කරුවන්ට ශ්‍රී ලංකාවේ අපනයන කර්මාන්ත ශාලා නැරඹීමට අවස්ථාව ලැබිණ. සාමාජිකයන් 12කින් සමන්විත වූ චීන දූත පිරිසට හිදැල්ලන තේ කර්මාන්ත ශාලාව ද, ඉතාලියේ ටෝයිස් සුපර් ඉන්ටර්නැෂනල් නියෝජිත පිරිසට ඒෂියා බයික්ස්, සැම්සන් බයික්ස්, BSH වෙන්චර්ස් ද, ඉතාලියේ BCD Progettisri නියෝජිත පිරිසටසියරා, ICC සහ ඇක්සස් කන්ස්ට්‍රක්ෂන්ස් කර්මාන්ත ශාලාද, දකුණු අප්‍රිකානු දූත පිරිසට කැළණි කේබල්ස්, ලලාන් රබර්, මල්ටිලැක්, නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස්, ලංකා හාන්ස්, ක්වීන්ස් වර්ක් වෙයාර් යනාදි කර්මාන්ත ශාලාද, චීන දූත පිරිසට තැප්‍රොබන් සී ෆුඩ්ස් සහ එළවලු සහ පළතුරු නිපදවන්නන්ගේ සංගමය මගින් සංවිධානය කරන ලද එළවලු හා පළතුරු සැකසීමේ කර්මාන්ත ශාලාව ද නැරඹීමේ අවස්ථා අපනයන සංවර්ධන මණ්ඩලය හා අනෙකුත් ආයතන එක්ව සංවිධානය කරන ලදී.

ප්‍රදර්ශනය හා සමගාමීව "ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් සංවර්ධන විභවතා සහ ආසියා පැසිෆික් කලාපයේ ජලජ සම්පත් පිළිබඳ විවරණය", "චීන ශ්‍රී ලංකා තාක්ෂණික සහයෝගිතාවය", "ජාත්‍යන්තර වෙළඳපල සඳහා හරිත පොල් නිෂ්පාදන", "නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ජාත්‍යන්තර වෙළඳපල අවස්ථා", "නැගී එන දැනුම් සේවා කේන්ද්‍රස්ථානය" සහ "ශ්‍රී ලංකා තේ වල අගය" යන මාතෘකා යටතේ අපනයන ප්‍රවර්ධන සම්මන්ත්‍රණයන් පැවැත්වූ අතර 897 දෙනෙකුගේ උද්යෝගී සහභාගීත්වය දක්නට ලැබිණ.






ජාත්‍යන්තර මාධ්‍ය ආවරණය වන පරිදි කැනඩාව, ඩුබායි, බහරේන්, රුසියාව, යුක්‍රේනය, බෙලරුස්, එක්සත් රාජධානිය, ප්‍රංශය, සෞදි අරාබිය, ඉන්දියාව, පිලිපීනය, පකිස්තානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජපානය, චීනය, නවසීලන්තය සහ ඕස්ට්‍රේලියාව යනාදී රටවල් 49කින් මෙම ප්‍රදර්ශනයට සහභාගී වූ අතර ගරු බැසිල් රාජපක්ෂ සහ ගරු රිෂාඩ් බදියුදීන් යන අමාත්‍යවරුන්, අමාත්‍යංශ ලේකම් අනුර සිරිවර්ධන මහතා මෙන්ම අමාත්‍යංශ නිලධාරීන් සමගද ඔවුහු සාකච්ඡා කලහ. එමෙන්ම ඔවුන් ප්‍රදර්ශන කුටි වල සිටි ප්‍රදර්ශකයින් සමගද සාකච්ඡා පවත් වන ලදි.

ප්‍රදර්ශනයෙන් ඇමරිකානු ඩොලර් බිලියනයකට ආසන්න වටිනාකමකින් යුත් ස්ථිර වෙළඳ ඇනවුම් 37ක්, හවුල් ව්‍යාපාර 35ක් සහ සාකච්ඡා මට්ටමේ වෙළඳ අවස්ථා 195ක් මෙන්ම බලාපොරොත්තු තැබිය හැකි වෙළඳ අවස්ථා 973ක් පමණ ශ්‍රී ලංකාවට පවත් වන ලදි.

අපනයන සේවා

- තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය කිරීමේ ක්ෂේත්‍රය.
අපනයන සංවර්ධන මණ්ඩලය, SLASSCOM සහ නුවර ප්‍රාදේශීය කාර්යාලය හා එක්ව මධ්‍යම පලාතේ තොරතුරු තාක්ෂණ සමාගම් 10ක් සඳහා Orim City තොරතුරු තාක්ෂණ උද්‍යානයේ (IT Park) හි අධ්‍යයන චාරිකාව.
- 2013 වසර අපනයන ගණනය කිරීම සඳහා සමීක්ෂණයක් පැවැත් වීමට කටයුතු කිරීම.
- අපනයනකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන සඳහා සුදුසු සමාගම් තෝරා ගැනීම සඳහා නෙදර්ලන්ත CBI ආයතනයේ විශේෂඥයෙකු සමග මෘදුකාංග සමාගම් 11ක් සඳහා ඇගැයීමේ චාරිකා සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ ක්ෂේත්‍රයන් සඳහා සන්නම් උපායමාර්ගයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු විශේෂඥයකු තෝරා ගැනීමේ කටයුතු අවසන් කිරීම.

වෘත්තීමය සේවා

- ජිනීවා නුවර ITC ආයතනය හා එක්ව සෞඛ්‍යාරක්ෂිත සංචරණය පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට ඇරඹීම.
- "2013 ආයුර්වේද එක්ස්පෝ" ප්‍රදර්ශනයේදී සෞඛ්‍යමය සේවා අපනයනය ප්‍රවර්ධනය සඳහා "ශ්‍රී ලංකා ආයුර්වේද" පිළිබඳ පත්‍රිකාවක්/පොතක් සැකසීම.
- ඉදිකිරීම් ක්ෂේත්‍රෙය් අපනයනයට නැඹුරු කොන්ත්‍රාත්කරුවන් කණ්ඩායමක් සැකසීම සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රෙය් යෙදෙන්නන්ගේ සංගමය හා එක්ව ක්‍රියා කිරීම.
- ඉලෙක්ට්‍රොනික් ක්ෂේත්‍රය.
ඉලෙක්ට්‍රොනික භාණ්ඩ අපනයනකරුවන්ට ලෝකයේ විශිෂ්ඨතම ක්‍රියාවන් පිළිබඳ දැනුවත් බව වර්ධනය කිරීමට සහ ඉලෙක්ට්‍රොනික අපනයන ක්ෂේත්‍රෙය් අපනයන හැකියාව වැඩි දියුණු කිරීම සඳහා IPC තාක්ෂණ හමුව (IPC Technology Meet) සංවිධානය කරන ලදී.

අනෙකුත් සංවර්ධන වැඩසටහන්

- ලියාපදිංචි තේ නිෂ්පාදකයන්, සකසන්නෝ සහ අපනයනකරුවන් සඳහා වෙන්කිරීමේ ක්ෂේත්‍ර හැකියාව (Grading Area Capacity) සංවර්ධනය කිරීමේ යෝජනා ක්‍රමය යටතේ සහනයක් ලබා දීම සඳහා සමාගම් 04ක් තෝරා ගන්නා ලදී.
- තේ ක්ෂේත්‍රය සඳහා පද්ධති/නිෂ්පාදන සහතිකකරණය සඳහා සහන ලබාදීමේ යෝජනා ක්‍රමය යටතේ කර්මාන්තශාලා 30ක් තෝරා ගන්නා ලදී. කර්මාන්ත ශාලා 18ක් ආවරණය වන පරිදි සමාගම් 02ක් සඳහා වැසි වනාන්තර සහතික (Rain Forest) ලබා ගැනීමට සහය ලබාදෙන ලදී. මෙයට අමතරව නිෂ්පාදන 01ක් සහ කර්මාන්ත ශාලා 11ක් සඳහා ISO සහතික ලබා ගැනීමට සහය වන ලදී.
- මාතර දිස්ත්‍රික්කයේ අක්කර 05ක භූමියක අන්නාසි වගා කිරීම සඳහා ගොවීන් 10කට සහනයක් ලබාදෙන ලදී. වගාව සඳහා අන්නාසි මොටෙයියන් 30 ක් දෙන ලදී.

- ශ්‍රී ලංකාවෙන් නැවුම් පළතුරු සහ එළවළු මාලදිවයිනට මුහුදු මගින් ගෙන යාමේ හැකියාව පිළිබඳ අධ්‍යයනයක් සිදුකරන ලදී. මේ සඳහා සුදුසු නාවි සමාගම් හඳුනාගෙන ඇති අතර වැඩිදුර සාකච්ඡා පවත්වනු ලබයි.
- පොල් කටු අඟුරු සෑදීම සඳහා සහන ලබා දීමේ යෝජනා ක්‍රමය යටතේ සමාගම් 05ක් තෝරා ගෙන තිබේ.
- නෙදර්ලන්ත ප්‍රවීණ විශේෂඥයෙකුගේ උපදේශකත්වයෙන් ශ්‍රී ලංකාවේ විසිතුරු මල් හා පත්‍ර කර්මාන්තයෙහි ඵලදායිතාව/ගුණත්වය වැඩි කිරීම මගින් අපනයනය ඉහළ නැංවීම සඳහා තාක්ෂණය/දැනුම හුවමාරු කිරීමේ වැඩ සටහනක් සංවිධානය කරන ලදී. මීට අමතරව විශේෂඥ මහතා ශ්‍රී ලාංකීය විසිතුරු පැල/මල් අපනයනකරුවන් 15 දෙනෙකුගේ වගා ගෘහයන් නැරඹීමට ද ගියේය.
- එක්සත් රාජධානියේ ඇඟළුම් විශේෂඥයකුගේ උපදේශකත්වයෙන් "නිෂ්පාදන කළමණාකාරිත්වය සහ තත්ත්වය රක්ෂණය" පිළිබඳ සමාගම් 09ක් සඳහා දින නවයක් පුරා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා එක්ව ඇඟළුම් ක්ෂේත්‍රය සඳහා ජාතික තත්වයක් (National Standard) සකස් කිරීමට ආරම්භ කරන ලදී.
- අන්තර්ජාතික වෙළඳපලේ ශ්‍රී ලංකා රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සවිස්තරාත්මක වාර්තාවක් යුරෝපීය රබර් වාර්තාවක 2013 ජූලි/අගෝස්තු කලාපයේ පල කරන ලදී. මෙම සඟරාවේ කතෘතුමා කරුණු එක් රැස් කිරීම සඳහා 2013 මැයි මස ශ්‍රී ලංකාවට පැමිණියේය.
- 2013 මාර්තු මස සුළු හා මධ්‍ය පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයින් 15ක් සඳහා "ආභරණ මෝස්තරකරණය" පිළිබඳ වැඩ මුළුවක් පවත්වන ලදී. එමෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ආභරණ නිෂ්පාදකයින් 23ක් සඳහා "නිම කිරීමේ විධි සහ අන්තර්ජාතික තත්වයන්/අවශ්‍යතා" පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.
- අන්තර්ජාතික සඟරාවල FACETS (ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය) ප්‍රචලිත කිරීමේ අරමුණින් සඟරා 03ක දැන්වීම් පල කිරීම. (Hi, Serendib, In Flight, Magazine, Incolor)
- ලී ආශ්‍රිත නිෂ්පාදන අපනයනයේ නැඹුරු නිෂ්පාදකයන් සඳහා අපනයන පිළිබඳ දැනුවත් කිරීම සඳහා එක් දින සම්මන්ත්‍රණයක් පැවැත්විය. කර්මාන්තයේ යෙදෙන සමාගම් 76ක් සහ ආරාධිතයන් 30ක් මෙයට සහභාගී විය.
- සාධාරණ වෙළඳාම (Fair Trade) , ශ්‍රී ලංකාවේ අත්කම් භාණ්ඩ ක්ෂේත්‍රය සඳහා අලවිකරණ උපකරණයක් ලෙස යොදා ගැනීමට හඳුන්වා දීමේ වැඩ සටහන යටතේ විශේෂඥයකුගේ ඇමරිකානු උපදේශකත්වයෙහි 2013 සැප්තැම්බර් මස පළමු වැඩසටහන ආරම්භ කරන ලදී.
  සම්පූර්ණ වැඩසටහන සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලීන් ඇගැයීමට කර්මාන්ත නැරඹීමේ චාරිකා 50ක් සිදු කිරීමට නියමිතය.
- වාත්තු කර්මාන්තය සඳහා යොදා ගැනෙන තාක්ෂණය වර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ සැප්තැම්බර් මාසයේදී යන්ත්‍රෝපකරණ සවි කිරීම සඳහා පරීක්ෂණ චාරිකා සිදු කිරීමට නියමිතය.
- ආසියානු රෙදිපිළි නිෂ්පාදන සඳහා ගෝලීය වෙළඳපල තත්වය පිළිබඳ සකස් කරන ලද වාර්තාව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට ලබා දෙන ලදී.

- සකස් කළ ආහාර පාන අපනයනයේදී අවශ්‍යවන කෝෂර් (Kosher) සහතිකය පිළිබඳ දැනුවත් කිරීම සඳහා 70 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ 02ක් පවත්වන ලදී.
- අපනයනකරුවන්ට තම අලවිකරණ හැකියාවන් වර්ධනය කරගැනීම සඳහා මූල්‍ය සහන ලබා දීමේ යෝජනා ක්‍රමය යටතේ සමාගම් 08ක් සඳහා සහන ලබා දී තිබේ.
- 17 දෙනෙකු සඳහා ඇසුරුම් තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වන ලදී.

## 06) ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්

අපනයන සංවර්ධනය උදෙසා ග්‍රාමීය සම්පත් හා හැකියාවන් දායක කර ගැනීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය ශාඛා ජාලය මගින් අදාල කාලය තුල ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන්වල ප්‍රගතිය පහත දැක්වේ.

- සන්නාම නාම සහ සන්නාම විශිෂ්ටත්වය සංවර්ධනය කිරීම සඳහා සහන සැලසීමේ යෝජනා ක්‍රමය යටතේ අදාල කාලය තුල සමාගම් 04කට සහන සැලසූ අතර 2013/2014 කාලය අවසන් වන විට සමාගම් 11කට සහන සැපයීමට අපේක්ෂිතය. මේ වනවිට ඉතාලියේ සහ මැද පෙරදිග කලාපයේ සන්නාම නාම දෙකක් ලියාපදිංචිය සිදු කෙරේ.
- කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත කරනු ලැබූ උපාධිධාරී අභ්‍යාසලාභීන් 146 දෙනෙක් සඳහා සේවා ලයිස්තු නිකුත් කරන ලදී. දිස්ත්‍රික්ක 25ක් සඳහා සංවර්ධන නිලධාරීන් 43ක් ඇතුලත්ව උපාධිධාරී අභ්‍යාසලාභීන් 222 ක් පත් කරන ලදී. මෙම පුහුණුවන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් පවත්වන ලදී.
- දකුණු පළාතේ කුළු බඩු සහ නිස්සාරක තෙල් නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා නිෂ්පාදන/පද්ධති සහතිකකරණය සහන සැලසීමේ යෝජනා ක්‍රමය යටතේ සහන සැලසීමට සුදුස්සන්21 ක්තෝරා ගන්නා ලදී.
  ගාල්ල දිස්ත්‍රික්කයේ GMP මධ්‍යස්ථාන 14ක් සහ රත්නපුර දිස්ත්‍රික්කයේ GMP මධ්‍යස්ථාන 01ක් ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදී.
- 2013 අගෝස්තු මස දකුණු පළාතේ සුදුසු කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදකයින් 12 දෙනෙකු සඳහා GMP සහතිකකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- දකුණු පළාතේ විසිතුරු මල් සහ පත්‍ර වාණිජ වගාවක් ලෙස ප්‍රවරධනය කිරීමේ යෝජනා ක්‍රමය යටතේ සහන සැලසීමට ව්‍යවසායකයින් 09 දෙනෙක් තෝරා ගන්නා ලදී.
- මධ්‍යම පළාතේ විසිතුරු පත්‍ර සහ ඕකිඩ් සැපයුම් සංවර්ධන වැඩ සටහන යටතේ දෙහිඔවිට ප්‍රදේශයේ වගාකරුවන් 35 දෙනෙකු සහ මාතලේ ප්‍රදේශයේ වගාකරුවන් 40 දෙනෙකු සංවර්ධනය කර අපනයනකරුවකුට සම්බන්ධ කරන ලදී.
- මධ්‍යම පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැල් ගමන තුල ඕකිඩ් වගා කිරීම සඳහා වගාකරුවන් දෙදෙනෙකුට මූල්‍ය සහන ලබාදෙන ලදී.
- සෙවන දැල් ගමන තුල ඉහළ වටිනාකමකින් යුතු එළවළු, අයිස් බර්ග් (සලාද කොළ විශේෂයක්), චෙරි තක්කාලි, බෙල් පෙපර්, ජපන් පිපිඤ්ඤා වගා කිරීම සඳහා ගොවීන් 26 දෙනෙකුට සහනයක් ලබා දී ඔවුන් අපනයනකරුවකු හා සම්බන්ධ කිරීම.

- වයඹ පළාතේ ගොවීන් 40 දෙනෙකු සඳහා ඉහළ වටිනාකමකින් යුතු එළවළු වගා කිරීමට සහනයක් සලසා ඔවුන් අපනයනකරුවකු හා සම්බන්ධ කිරීම.
- නැගෙනහිර පළාතේ වැසි ආවරණ වගා ගෘහ තුල ගර්කින්, හැලපිනෝ, ගම්මිරිස් වගා කිරීම සඳහා ගොවීන් 22කට සහන සලසා අපනයන සංවර්ධන මණ්ඩලය, ගොවීන් සහ අපනයනකරුවකු සමග ත්‍රි පාර්ශ්වික ගිවිසුමකට එලඹෙමින් ඔවුන් අපනයනය කිරීමේ මාර්ගයකටප්‍රවේශකරන ලදී.පදියතලාවේ සහ අක්කරපත්තුවේ වැසි ආවරණ වගා ගෘහ 22ක් පිහිටුවන ලදී.
- අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන් 40ක් සඳහා කෘෂි අපනයන නිෂ්පාදන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

  ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ගොවීන් 35 දෙනෙකුට පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

  අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව නාමල් ඔය ප්‍රදේශයේ කුරුඳු තලන්නන් 18 දෙනෙකු සඳහා තාක්ෂණ හුවමාරු වැඩසටහන.
- ඌව පළාතේ කුළු බඩු සහ නිස්සාරක තෙල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ නිෂ්පාදන/පද්ධති සහතිකකරණය පිළිබඳ සහන සැලසීමේ යෝජනා ක්‍රමය යටතේ GMP මධ්‍යස්ථාන දෙකක වැඩ කටයුතු සම්පූර්ණ කරන ලදී.
- ඌව පළාතේ සෙවන දැල් ගෘහ තුල බෙල් පෙපර් සහ තක්කාලි වගා කිරීම සඳහා ගොවීන් 17 දෙනෙකුට සහන සලසන ලදී.
- කහ වගාව සඳහා වගා ද්‍රව්‍ය සහ තාක්ෂණ සහනයන් ලබා දීම සඳහා ගොවීන් 25 දෙනෙකු තෝරා ගන්නා ලදී. 2013 අප්‍රේල් 05 වන දින ඔවුන්ට තාක්ෂණ පුහුණු වැඩ සටහනක් පවත්වන ලදී. ගොවීන් 14 දෙනෙකු සඳහා වගා ද්‍රව්‍ය බෙදා දී ඇති අතර දැනටමත් වගා කටයුතු සිදු වේ.
- අපනයන වෙළඳපලට සුදුසු පරිදි සෙරමික් සහ පිඟන් භාණ්ඩ සංවර්ධනය කිරීම සඳහා මොණරාගල දිස්ත්‍රික්කයේ කොවුලාර සමුපකාර සමිති කර්මාන්තකරුවන්ට මැටි සැකසුම් යන්ත්‍රෝපකරණ පිහිටුවීම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් අපනයනකරුවකු හා සම්බන්ධ කිරීම. එමෙන්ම සමිතිය විසින් මේ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට කොන්ත්‍රාත්තුව භාර දී තිබේ.
- අලෙවිකරණ අවස්ථා සහ එහිදී ඇතිවන බාධක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදී.
- වීරවිල කෘෂි අපනයන කලාපයේ උද්‍යාන වගා කිරීමේ ව්‍යාපෘතිය පියවර දෙකක් යටතේ සිදු කිරීමට නියමිත අතර පලමු අදියර යටතේ අක්කර 18ක භූමියක ආදර්ශ ගොවිපලක් සාර්ථකව නිම කිරීමට හැකි විය. ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා කළමණාකරන මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.
- දඹදෙණිය සහ තිස්සමහාරාම අපනයන සැකසුම් කලාපයන් දී භාණ්ඩ සහ වෙළඳපල විවිධාංගීකරණය ආරම්භ කිරීම සහ කලාපයන් හි වැඩ කටයුතු පසු විපරම හා අධීක්ෂණය කිරීම.

  අදාල කාලය තුල තිස්සමහාරාම අපනයන සැකසුම් කලාපයේ මූලා ප්‍රගතිය වනුයේ තේ පැකට් සංඛ්‍යාව - 133, 748 සහ වටිනාකම රු. මිලියන 5.55 කි. නිෂ්පාදන විවිධාංගීකරණය යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා රසායනාගාර දැල් රෙදි (Surgical Gauze) සැපයීම සඳහා ලියාපදිංචි සහතිකයක් ලබාගන්නා ලදී.

- බිංගිරිය කෘෂි අපනයන කලාපයේ වගාකරුවන් 250 දෙනෙක් සහ තවත් 200 දෙනෙකුට ස්වාභාවික ආවරණ යටතේ විසිතුරු පත්‍ර ලබා ගැනීම සඳහා පැල වගා කිරීමේ තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදී.

  බිංගිරිය කෘෂි අපනයන කලාපයේ ප්‍රගතිය,

  ඇන්තූරියම් ඍජු අපනයන - රුපියල් 564, 925

  සැන්ඩ්‍රියානා ඍජු අපනයන - රුපියල් 881, 944

- 2013 මැයි 30 සිට ජුනි 02 දක්වා "බිංගිරිය මල් වසන්තය" වෙළඳ ප්‍රදර්ශනය සාර්ථකව නිම කරන ලදී.

## 07) අනෙකුත් වැඩසටහන්

### තොරතුරු තාක්ෂණ සේවා

අපනයන සංවර්ධන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශය මගින් වෙළඳ ප්‍රජාව සඳහා විද්‍යුත් වාණිජ සේවා සපයනු ලැබේ. ඊට අමතරව ප්‍රාදේශියව විසිරී සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ද විද්‍යුත් ව්‍යාපාර තාක්ෂණයන් යොදා ගැනීමේ පහසුව ඇති කිරීමට දකුණු, වයඹ සහ මධ්‍යම පලාත් ප්‍රාදේශිය කාර්යාල ජාලය ද ශක්තිමත් කරන ලදී. අදාල කාලය තුල පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

### ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවා විද්‍යුත් මාධ්‍යය ප්‍රවර්ධනය කිරීම.

අපනයනකරුවන් සඳහා අන්තර්ජාලය ඔස්සේ යාවත්කාලීන අපනයන ප්‍රගති දත්ත වාර්තා ලබා ගැනීමත් එමගින් තිර හා වක්‍ර ප්‍රස්ථාර ඉක්මණින් කර ගැනීමටත් හැකිවන පරිදි පහසුකම් ඇති කිරීම.

අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සංවිධානය කරනු ලබන වෙළඳ ප්‍රදර්ශන සහභාගිත්වයන්, ප්‍රවර්ධන වැඩසටහන්, වෙළඳපල පිළිබඳ සකස් කරන ලද වාර්තා, වෙළඳපල විමසීමේ මාර්ගෝපදේශ, ප්‍රවණතා පිළිබඳ වාර්තා, ගැණුම්කරුවන්ගේ තොරතුරු අපනයන සංවර්ධන මණ්ඩලය මගින් දෙනු ලබන සහනයන් යනාදී සියළුම ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි තොරතුරු වෙබ් අඩවියේ යාවත්කාලීනව පළ කිරීම. 2013 වසර සඳහා ප්‍රවෘත්ති විපරම් සංඥාවන් පළ කිරීම සහ අන්තර්ජාතික වෙළඳ පලේ නව රෙගුලාසි, වෙළඳපල ප්‍රවණතා, අවස්ථාවන් සහ නව ව්‍යාපාරික පුරෝකතන පිළිබඳ අපනයන ප්‍රජාව දැනුවත් කිරීම සඳහා නිෂ්පාදන සහ වෙළඳපල ප්‍රවෘත්ති නිවේදන 65ක් පළ කිරීම. වෙබ් අඩවි අන්තර්ගතය සඳහා දෙමළ භාෂාව ඇතුළු භාෂාවන් 72ක් පමණ ඇතුළු කිරීම.

පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයන්ගේ සමුළුව හා සමගාමීව ඉදිරි නොවැම්බර් 13 සිට 17 දක්වා බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේදී පැවැත්වීමට නියමිත "Reflection Sri Lanka" - ආසියාවේ ගවේෂණය සඳහා වෙළඳ, සංචාරක හා ආයෝජන ප්‍රදර්ශනය උදෙසා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම.

### විද්‍යුත් වාණිජ බිහිදොර (විද්‍යුත් වෙළඳ මධ්‍යස්ථානය)

අපනයන සංවර්ධන මණ්ඩලය නිල වෙබ් අඩවිය වන www.srilankabusiness.comතුලින් ක්‍රියාත්මක වන වාණිජ්‍ය බිහිදොර මගින් අදාල කාලය තුල ඇමරිකානු ඩොලර් මිලියන2555ක වටිනාකමකින් යුතු ඉතාලිය, රුසියාව, ජපානය, ඕස්ට්‍රේලියාව, චෙක් ජනපදය සහ පිලිපීනය යන රටවලට සාර්ථක වෙළඳ ගනුදෙනු සිදු කරන ලදී.

මීට අමතරව අදාල කාලය තුල වෙළඳ ඇණවුම් 18ක් ලියාපදිංචිව සිට සමාගම් සඳහා ලැබිණ.

### විද්‍යුත් වාණිජ සේවා ප්‍රවර්ධනය

අදාල කාලය තුල බාහිර පාරිභෝගිකයන්ට සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරින්ට අන්තර්ජාලය මගින් ගැණුම් කරුවන් සෙවීම් 2312 ක් කරන ලදී.

එමෙන්ම අපනයන සංඛ්‍යා දත්ත, පාරිභෝගිකයන් 160කටද තෝරාගත් නිෂ්පාදන වල මිල ගණන් 25 දෙනෙකුට ලබාදෙන ලදී.

### වෙළඳ තොරතුරු සහ උපදේශක සේවා

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයන ක්ෂේත්‍රය සඳහා පරිගණකගත වෙළඳ දත්ත පහසුකම් උපදේශක සේවා, ප්‍රකාශන සහ පුස්තකාල සේවා යනාදී විවිධ සේවාවන් රාශියක් සපයනු ලබයි. අදාල කාලය තුල ව්‍යවසායකයින් 564කට ආසන්න ප්‍රමාණයකට පුස්තකාල පහසුකම් ලබා දෙන ලදී.

මීට අමතරව අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා එහි ප්‍රාදේශීය ශාඛා කාර්යාල ජාලය මගින් අපනයනකරුවන් 475කට අධික ප්‍රමාණයකට අපනයනය හා ආශ්‍රිත ක්ෂේත්‍රයන් පිළිබඳ උපදේශක සේවා ලබා දෙන ලදී.

### අපනයන ආශ්‍රිත ප්‍රකාශන

මෙම කාලය තුල “Business Lanka” සඟරාවක් “Expo News” ප්‍රකාශන 16ක්, “අපනයන පුවත්“ ප්‍රකාශන 08ක් ප්‍රකාශයට පත්කොට ග්‍රාහකයින් වෙත ලබා දී ඇත.

එමෙන්ම “Policy Briefly” ප්‍රකාශන 06ක් මණ්ඩලයේ නිලධාරින් අතර බෙදා දෙන ලදී.

### අපනයන ප්‍රගති දර්ශක 2003 – 2012

පසුගිය දශකයේ අපනයන සංඛ්‍යා දත්තයන් විශ්ලේෂනය කර “අපනයන ප්‍රගති දර්ශක“ නමින් සවිස්තරාත්මක ප්‍රකාශනයක් සකස් කරන ලදී. මෙය සංයුක්ත තැටියක් ලෙසට ප්‍රකාශයට පත්කළ අතර එය අදාල ආයතන වාණිජ මණ්ඩල හා විශ්ව විද්‍යාල සඳහා බෙදා හරින ලදී.

**ව්‍යවසායකයින්ගේ ගැටළු විසඳීම**

ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් "අපනයන සංසදය" සංවිධානය කරන ලදී.

වෙළඳ කටයුතු සම්බන්ධයෙන් වන විශේෂිත ගැටළු සාකච්ඡා කිරීමට පොදු වේදිකාවක් බඳු මේ සඳහා අපනයනකරුවන්, ආයෝජකයන් සහ අනෙකුත් ව්‍යවසායකයන් මෙන්ම රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් හි නිලධාරින්ද සහභාගි වේ.

අදාල කාලය තුල අපනයන සංසදයන් එකක් පැවැත් වූ අතර ගැටළු 30ක් පමණ සාකච්ඡා කරන ලදී.

**ඇසුරුම්කරණ සංවර්ධන වැඩසටහන්**

අපනයන සංවර්ධන මණ්ඩලය හා අනුබද්ධිත ඇසුරුම්කරණ මධ්‍යස්ථානය විසින් අපනයනයට නැඹුරු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා තත්වයෙන් උසස්, විශ්වාසනීය සහ අඩු පිරිවැයකින් යුතු ඇසුරුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් වැඩසටහන් 02ක් කොළඹදී සහ හම්බන්තොටදී එක් වැඩසටහනක් සිදු කරන ලදී. එහිදී නැවුම් සහ අගය එකතු කළ කෘෂි නිෂ්පාදන ඇසුරුම්, අත් යන්ත්‍ර සහ රෙදිපිළි නිෂ්පාදන සඳහා ඇසුරුම්, නව ඇසුරුම්කරණ විධි, ආහාර ද්‍රව්‍ය ඇසුරුම්, ඇසුරුම් ද්‍රව්‍ය, අගය එකතු කිරීමක් ලෙසින් හා අලෙවි උපායක් ලෙස ඇසුරුම්කරණය ඇසුරුම් ලේබල් යනාදී ප්‍රධාන විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි දේශන පැවැත්විණ.

ඇසුරුම් නිෂ්පාදන කර්මාන්තයේ නියුතු විධායක නිලධාරීන් සඳහා "ඇසුරුම් තාක්ෂණය" මැයෙන් සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදනයන් හි තත්වය සහ වෙළඳපල තරඟකාරිත්වය සංවර්ධනය කිරීමට "අපනයන ඇසුරුම්කරණය" සඳහා උපදේශක සභාවක් පිහිටුවීම.

**නිපුණතා සංවර්ධන සහ පුහුණු වැඩසටහන්**

අදාල කාලය තුල අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කොළඹ, ගාල්ල, අම්පාර, ත්‍රිකුණාමලය, නාමල් ඔය, හම්බන්තොට සහ බිංගිරිය යනප්‍රදේශවල ව්‍යවසායකයින් 1188 දෙනෙක් සඳහා නිපුණතා සංවර්ධන සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

අපනයන කෘෂි නිෂ්පාදනයන්, පසු අස්වනු තාක්ෂණය, ආභරණ මෝස්තර, අත්‍යවශ්‍ය සහතික වර්ග සහ ඇසුරුම් තාක්ෂණය පිළිබඳ දැනුම ලබා දීමත් නිෂ්පාදන සඳහා විශේෂිත තාක්ෂණ කුසලතා වර්ධනය කිරීමත අරමුණු කොටගෙන මෙම වැඩ සටහන් ක්‍රයාත්මක කරන ලදී.

අදාල කාලය තුල ව්‍යවසායකයින් 150කට ආසන්න ප්‍රමාණයක් සඳහා ආයනය/අපනයන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවන් 04ක් සහ අන්තර්ජාතික වෙළඳාමේ ක්‍රියා පිළිවෙල පිළිබඳ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

# 2014 වසර සඳහා සැලසුම්

## අපනයන ප්‍රවර්ධන වැඩ සටහන්

කෘෂිකාර්මික, ධීවර, කාර්මික සහ සේවා ක්ෂේත්‍ර ප්‍රවර්ධනය සඳහා ඒකාබද්ධ සැපයුම් / නිෂ්පාදන / මෝස්තර / තත්ව සහ ඇසුරුම්කරණ සහ වෙළඳපල සංවර්ධන වැඩ සටහන්

- අපනයන ආදායම වැඩිකිරීම සඳහා සාමූහික සන්නාමකරණය (Corporate Branding) සඳහා සහන සැලසීම.
- "ජාතික අපනයන ප්‍රතිපත්තිය" කෙටුම්පත් කිරීම.
- අපනයන නැඹුරුවක් ඇති ශ්‍රී ලාංකීය නිෂ්පාදන සඳහා භූගෝලීය දර්ශකය (GI) ලබා ගැනීම.
- අගය එකතු කළ නිෂ්පාදනය සඳහා නිෂ්පාදන හා පද්ධති සහතිකරණය සහ සෞඛ්‍ය ආරක්ෂිත නිෂ්පාදන ක්‍රම (GMP) සඳහා සහන සැලසීම
- ශ්‍රී ලංකා කුරුඳු සන්නාම සංවර්ධන වැඩ සටහන, තෝරා ගත් අන්තර්ජාතික වෙළඳ පල වල වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම.
- Infofish - CFC, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන ව්‍යාපෘතිය ආරම්භ කිරීම.
- කාබනික සහතිකකරණය සඳහා පිරිවැය අවම කිරීමට ජාතික කාබනික පාලන අධිකාරිය (NOCA) පිහිටුවන තුරු Noacc කටයුතු පවත්වාගෙන යාම.
- ඇඟළුම් ක්ෂේත්‍රය සඳහා ඵලදායිතා වර්ධන වැඩ සටහන.
- ඇඟළුම් ක්ෂේත්‍රය සඳහා ප්‍රතිරූපය ගොඩ නැගීමේ වැඩ සටහන.
- ශ්‍රී ලංකා ඇඟළුම් ක්ෂේත්‍රයේ හැකියාවන් පෙන්වීම සඳහා ශ්‍රී ලංකා මෝස්තර සැණකෙළිය සංවිධානය කිරීම.
- අන්තර්ජාතික වෙළඳ පලවල ශ්‍රී ලංකා රබර් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීම.
- "ශ්‍රී ලංකා බ්ලූ සෆායර්" (නිල් මැණික්) සන්නාම ප්‍රවර්ධනය සඳහා ප්‍රචාරාත්මක / ප්‍රතිරූපය ගොඩනැගීමේ වැඩ සටහන
- ලෝක වෙළඳ පල තරඟකාරීත්වය වැඩි කිරීම සඳහා සෙරමික් ක්ෂේත්‍රයේ ඵලදායිතාව වර්ධනය කිරීමේ වැඩ සටහන.
- සුළු හා මධ්‍ය පරිමාණ අත්යන්ත්‍ර ඇඟළුම් අපනයනකරුවන්ගේ නිෂ්පාදන හා වෙළඳ පල ප්‍රවණතා පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීමේ වැඩ සටහන
- තොරතුරු තාක්ෂණ / ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණයේ නිරත වන අපනයනකරුවන්ගේ උපාය මාර්ගික අවශ්‍යතා සපුරාලීමට ශ්‍රී ලංකාවේ 2013/14වසරවලදී සම්මන්ත්‍රණයක් පැවැත්වීම.

- තොරතුරු තාක්ෂණ / ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණයේ නිරත වන අපනයනකරුවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා අදාල ක්ෂේත්‍රයන් එක් කර සම්මන්ත්‍රණ සංවිධානය කිරීම (ICT කර්මාන්ත, විදුලි සංදේශ සහ විශ්ව විද්‍යාල)

- ලෝක වෙළඳ පලේ පුද්ගල සබඳතා ගොඩ නගා ගැනීමෙන් "ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය" සන්නාම කිරීම සහ ප්‍රවර්ධනය.

- ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයේ අපනයනකරුවන් සඳහා ශ්‍රී ලාංකීය සැපයුම්කරුවන්ගේ තත්ත්ව වර්ධන වැඩ සටහන්.

- කෘෂිකාර්මික, කාර්මික සහ ධීවර අංශයන් හි තත්ව සංවර්ධන වැඩ සටහන්.

- කුළු බඩු ආශ්‍රිත නිෂ්පාදන අංශය සඳහා සංවර්ධන හා ප්‍රවර්ධන වැඩ සටහන්.

- මුද්‍රණ ක්ෂේත්‍රය සඳහා තාක්ෂණ සංවර්ධන වැඩ සටහන්.

- බෝට්ටු කර්මාන්තය සඳහා ඵලදායිතාවය සංවර්ධන වැඩ සටහන්.

- අපනයනයට සූදානම් සුළු හා මධ්‍ය පරිමාණ ත්‍යාග භාණ්ඩ නිෂ්පාදකයන් සංවර්ධන වැඩ සටහන.

- පාවහන් කර්මාන්තය සඳහා තාක්ෂණ සංවර්ධන වැඩ සටහන.

- සියළුම භාණ්ඩ අංශ සඳහා දැනුවත් කිරීමේ වැඩ මුළු, වැඩ සටහන් සහ වෙළඳ පල ප්‍රවර්ධන වැඩ සටහන් සංවිධානය

**ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන්**

- කෘෂි අපනයන කලාප ව්‍යාපෘති තවදුරටත් කරගෙන යෑම.

- වයඹ පළාතේ කොහු කර්මාන්තය සඳහා තිරසාර ශක්ති කළමණාකරන වැඩ සටහන

- වයඹ පළාතේ කැපූ මල් හා විසිතුරු පැල සංවර්ධන ව්‍යාපෘති

- වයඹ පළාතේ අපනයනය සඳහා කාබනිකව මිරිස් සහ කහ වගා කිරීම සංවිධානය

- මධ්‍යම පළාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් එක් කිරීමේ වැඩ සටහන

- සැපයුම් සංවර්ධනයට වයඹ පළාතේ අපනයනය සඳහා වටිනාකමින් වැඩි එළවළු සහ කුළු බඩු ව්‍යාපෘතිය

- දකුණු පළාතේ කුරුඳු සැකසුම් කර්මාන්ත ශාලා සහ නිස්සාරක තෙල් නිෂ්පාදන ස්ථාන සඳහා තත්ත්ව සහතික ලබා ගැනීමට සහායවීම.

- මඩකලපුව දිස්ත්‍රික්කයේ අපනයනය සඳහා අන්නාසි වගා කිරීමේ නියමු ව්‍යාපෘතිය සහ අම්පාර දිස්ත්‍රික්කයේ අන්නාසි පැල තවාන් සැකසීම සංවිධානය

**වෙළඳපල සංවර්ධන වැඩ සටහන්**

- නැගී එන වෙළඳපල වල අවස්ථා ගවේෂණය කිරීම. (බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය, දකුණු අප්‍රිකාව, දකුණු කොරියාව, ඉස්මීර්, තුර්කිය)
- තෝරා ගත් ප්‍රමුඛ සහ නැගී එන වෙළඳ පලවල අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කිරීම.
- තෝරා ගත් වෙළඳ පලවල අභ්‍යන්තර සහ බාහිර වෙළඳ ධූත නියෝජනයන් සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකා අපනයන ක්ෂේත්‍රයේ ප්‍රතිරූපය ගොඩ නැගීම සඳහා සුදුසු වෙළඳ පල සන්නිවේදන උපායයක් ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකා නිෂ්පාදන සහ සේවා අනෙකුත් රටවල ප්‍රවර්ධනය සඳහා ධූත මෙහෙවරේ යෙදෙන වාණිජ දෙපාර්තමේන්තු නිලධාරීන් හා සමීපව කටයුතු කිරීම.
- වෙළඳපල පර්යේෂණ / සමීක්ෂණ සිදු කිරීම.
- ජනාධිපති අපනයන සම්මාන ප්‍රදානෝත්සවය සංවිධානය කිරීම.
- දේශීය වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම.
- දේශීය වෙළඳ ප්‍රදර්ශනවල ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ සහභාගීත්වය සංවිධානය කිරීම.උදා. Facets, Luster, Ayurveda, Profoods
- Boat Show 2013 සහ පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකා එක්ස්පෝ 2014 අන්තර් ජාතික වෙළඳ ප්‍රදර්ශනය සංවිධානය කිරීම.

**වෙනත් වැඩ සටහන්**

- අපනයන ඇසුරුම්කරණය සංවර්ධනය
- වෙළඳ තොරතුරු හා වෙළඳ පලතොරතුරු බෙදා හැරීම විද්‍යුත් වාණිජ්‍ය සේවා සහ අපනයන ආශ්‍රිත ප්‍රකාශන
- අපනයනකරුවන්ගේ ගැටළු නිරාකරණය (අපනයනකරුවන්ගේ සංසදය)
- ආනයන අපනයන ක්‍රියාවලිය හා අපනයන ඇසුරුම්කරණය පිළිබඳ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අපනයන ආශ්‍රිත විෂයයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන්, කුසලතා සංවර්ධන වැඩ සටහන් සහ ව්‍යවසායකයන් සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය.

## 2013.12.31. දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය.

| | සටහන. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2013 Rs. Cts. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2012 Rs. Cts. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ශුද්ධ දේපල පිරියත හා උපකරණ | (9) | 69,164,698.78 | 78,007,502.84 |
| සඳහන් නොකෙරුණු සමාගම් ආයෝජන | (10) | 805,459,768.00 | 339,120,793.00 |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | (11) | 40,548,150.00 | 40,548,150.00 |
| | | 915,172,616.78 | 457,676,445.84 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | (12) | 1,330,321.91 | 1,344,128.63 |
| විකිණීමට ඇති ජංගම නොවන වත්කම් | | - | 1,036,995.14 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | (13) | 150,237,754.18 | 150,219,263.34 |
| අත්තිකාරම් හා ඉදිරි ගෙවීම් | (14) | 40,694,347.10 | 31,086,608.69 |
| මුදල් හා මුදල් සමාන දෑ | (15) | 16,852,165.84 | 1,917,312.52 |
| | | 209,114,589.03 | 185,604,308.32 |
| **මුළු වත්කම්** | | 1,124,287,205.81 | 643,280,754.16 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධන සහ වෙන් කිරීම්** | | | |
| ආධාර ලැබීම් | (16) | 20,706,020.21 | 22,049,098.94 |
| වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | 920,619,619.11 | 401,627,915.94 |
| මුළු හිමිකම් | | 941,325,639.32 | 423,677,014.88 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| වෙන්කිරීම් හා අනිකුත් වගකීම් | (17) | 22,089,408.88 | 21,746,707.68 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | (18) | 79,955,076.27 | 79,631,378.23 |
| | | 102,044,485.15 | 101,378,085.91 |
| අනෙකුත් ගෙවීම් | (19) | 63,768,000.39 | 62,335,549.84 |
| බැංකු අයිරාව | (20) | 17,149,080.95 | 55,890,103.53 |
| | | 80,917,081.34 | 118,225,653.37 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | 1,124,287,205.81 | 643,280,754.16 |

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරණු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2013. 12. 31 දිනට අත්සන් කලේ

.....................................

බන්දුල එගොඩගේ

**සභාපති හා ප්‍රධාන විධායක.**

..........................

පී.කේ. සුමිත්‍රාරච්චි.

**මූල්‍ය අධ්‍යක්ෂ.**

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## 2012.12.31. දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය.

| | සටහන | එස්.එල්.එෆ්.ආර්එස් 31.12.2013 Rs. Cts. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2012 Rs. Cts. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ආදායම | (3) | 558,606,933.51 | 536,594,124.06 |
| අනෙකුත් ආදායම් | (4) | 98,471,989.91 | 51,103,968.17 |
| මුළු ආදායම | | 657,078,923.42 | 587,698,092.23 |
| **වියදම්** | | | |
| අපනයන සංවර්ධන වියදම | (5) | (234,406,882.33) | (332,186,795.04) |
| පරිපාලන වියදම | (6) | (320,671,883.37) | (313,502,891.88) |
| මෙහෙයුම් වියදම් ඉක්මවූ ආදායම | | 102,000,157.72 | (57,991,594.69) |
| මූල්‍ය වියදම් | (7) | (1,485,313.55) | (2,314,104.20) |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වියදම ඉක්මවූ අතිරික්තය | | 100,514,844.17 | (60,305,698.89) |
| **අනිකුත් විස්තීරණ ආදායම්** | | | |
| දේපල හා පිරියත උපලබ්ධියෙන් ලාභ | (8) | - | 28,248,943.98 |
| ආයු ගණක ලාභ නිර්වප්පිත ප්‍රතිලාභ සැලසුම්මත | | - | |
| විදේශ කටයුතු මත මූල්‍ය ප්‍රකාශන පරිවර්තන සඳහා--ලාභය/පාඩුව. | | - | |
| මූල්‍ය වත්කම් විකිණීමෙන් ලාභ(පාඩු) | | - | |
| වර්ෂයේ අනිකුත් මුළු ආදායම | | - | 28,248,943.98 |
| **වර්ෂයේ මුළු ආදායම** | | 100,514,844.17 | (32,056,754.91) |

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## 2013.12.31 දිනට අවසන් වර්ෂය සඳහා -මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

| | 2013 (රු) |
|---|---|
| **මෙහෙයුම් වලින් ලද මුදල් ප්‍රවාහය** | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද වියදමට වැඩි ආදායම. | 100,514,844 |
| | |
| **ගැලපීම්** | |
| ක්ෂයවීම් | 10,059,461 |
| ආයෝජන වලින් ලද ආදායම | (86,247,556) |
| දේපල පිරියත උපකරණ විකිණීමෙන් ලද ලාභය | 1,184,057 |
| පෙර වර්ෂය සඳහා ගැලපුම් | 418,476,859 |
| මූල්‍ය වියදම | 1,485,314 |
| ආයෝජන ඇවර කිරීමේ පාඩුව | - |
| රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය | (1,343,079) |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 9,703,140 |
| ආයෝජන සඳහා වෙන්කිරීම් වෙනස්වීම් | |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය.** | **453,833,040** |
| | |
| තොගය (වැඩිවීම/අඩුවීම) | 13,807 |
| ණය ගැති හා ලැබියයුතු දෑ (වැඩිවීම/අඩුවීම) | (18,491) |
| අත්තිකාරම් හා කලින් ගෙවීම්(වැඩිවීම/අඩුවීම) | (9,607,738) |
| වෙන්කිරීම් හා වෙනත් ගෙවියයුතු දෑ(වැඩිවීම/අඩුවීම) | 342,701 |
| වෙනත් ගෙවියයුතු දෑ (වැඩිවීම අඩුවීම) | 1,432,451 |
| **මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය.** | **445,995,769** |
| | |
| මූල්‍ය වියදම් ගෙවීම් | (1,485,314) |
| පාරිතෝෂික ගෙවීම් | (9,379,442) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ගලායාම** | **435,131,014** |
| | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | |
| ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම් | (1,756,112) |
| ස්ථාවර වත්කම් විකිනීමෙන් ලද මුදල් | 392,394 |
| සමාගම් කොටස් වලින් ලද ආදායම | 47,862,116 |
| ලාභාංශ ලැබීම් | 36,415,076 |
| පොලී ලැබීම් | 1,970,364 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලා ශුද්ධ මුදල් ගලාඑම** | **84,883,837** |

| | |
|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම් ජනනය වූ මුදල් ප්‍රවාහය.** | |
| කොටස් ආයෝජන | (466,338,975) |
| ආයෝජන නිදහස් කිරීම් | - |
| **මූල්‍ය ක්‍රියායාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය.** | **(466,338,975)** |
| **වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දෑ වැඩිවීම/අඩුවීම** | **53,675,876** |
| වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දෑ | **(53,972,791)** |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | **(296,915)** |

**මුදල් හා මුදල් සමානම දෑ විශ්ලේෂණය**

| | |
|---|---|
| බැංකුවේ ඇති මුදල් | 16,852,166 |
| අතැති මුදල් | (17,149,081) |
| | **(296,915)** |

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය.

## 2013.12.31. දිනට අවසන් වර්ෂය සඳහා

## හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය.

| | | රාජ්‍ය ආධාර | සමුච්චිත ලාභ | එකතුව |
|---|---|---|---|---|
| 2012.01.01 දිනට ශේෂය | | 10,229,677.67 | 467,767,112.91 | 477,996,790.58 |
| සාමාන්‍ය ක්‍රියා වලින් වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | - | (32,056,754.97) | (32,056,754.97) |
| රාජ්‍ය ආධාර එකතු කිරීම | | 13,000,000.00 | - | 13,000,000.00 |
| රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය | | (1,180,578.73) | - | (1,180,578.73) |
| පෙර වර්ෂයේ ගැලපීම් | | - | (34,082,442.00) | (34,082,442.00) |
| 2012.12.31. දිනට ශේෂය | | 22,049,098.94 | 401,627,915.94 | 423,677,014.88 |
| සාමාන්‍ය ක්‍රියා වලින් වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | - | 100,514,844.17 | 100,514,844.17 |
| රාජ්‍ය ආධාර එකතු කිරීම් | | (1,343,078.73) | - | (1,343,078.73) |
| පසුගිය වර්ෂයේ ගැලපුම් | (21) | - | 418,476,859.00 | 418,476,859.00 |
| 2013.12.31. දිනට ශේෂය | | 20,706,020.21 | 920,619,619.11 | 941,325,639.32 |

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
## 2013.12.31. දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්

| | | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2013 Rs. Cts. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2012 Rs. Cts. |
|---|---|---|---|
| (3) | **ආදායම** | | |
| | රාජ්‍ය ලැබීම් | 483,950,000.00 | 432,809,000.00 |
| | ආනයන සේවා ආදායම් | 43,609,547.97 | 42,677,230.75 |
| | CHOGM 2013 | 19,692,435.47 | - |
| | පළාත් කාර්යාල ආදායම් | 38,514.62 | 169,206.89 |
| | අන්තර්ජාල ආදායම් | 303,609.00 | 284,300.00 |
| | විද්‍යුත් වෙළඳ ආදායම | 110,195.32 | 2,061,320.92 |
| | එක්ස්පෝ 2012 ආදායම් | 1,504,176.28 | 48,939,145.32 |
| | සම්මන්ත්‍රණ හා පාඨමාලා ගාස්තු | 1,875,350.00 | 9,375,114.18 |
| | වෙළඳකුටිආදායම- සම්භාණ්ඩප්‍රදර්ශන | 7,221,848.85 | - |
| | පොත් අලෙවිය | 232,856.00 | 235,574.00 |
| | අනෙකුත් ආදායම් | 68,400.00 | 43,232.00 |
| | | **558,606,933.51** | **536,594,124.06** |
| (4) | **අනෙකුත් ආදායම්** | | |
| | පොලී ආදායම් | 1,970,363.53 | 2,002,980.03 |
| | ආශ්‍රිත සමාගම් ලාභ | 47,862,116.00 | 41,094,809.80 |
| | ලාභාංශ | 36,415,076.22 | 6,989,793.80 |
| | ආයෝජන ඇවර කිරීමේ පාඩු | - | (1,635,983.19) |
| | අනිකුත් විවිධ ආදායම් | 4,533,445.38 | 250,250.00 |
| | ක්‍රමක්ෂය රාජ්‍ය ආධාර | 1,343,078.73 | 1,180,578.73 |
| | සේවක ණය පොලී | 6,007,785.90 | 1,221,539.00 |
| | විනිමය අනුපාත වෙනස | 340,124.15 | - |
| | | **98,471,989.91** | **51,103,968.17** |
| (5) | **අපනයන සංවර්ධන වියදම්** | | |
| | අපනයන සංවර්ධන වැඩසටහන් | 78,062,093.57 | 85,369,598.80 |
| | EU ශ්‍රී ලංකා කාබනික *නිශ්පාදන* | 1,503,150.41 | 1,668,956.21 |
| | අපනයන වෙළඳ ප්‍රවර්ධන | 59,412,217.82 | 186,314,512.49 |
| | CHOGM 2013 | 34,270,326.12 | - |
| | වෙළඳ නියෝජිත සහභාගිත්වය | 971,371.20 | 1,140,059.45 |
| | දේශීය වෙළඳ ප්‍රදර්ශන | 341,208.60 | 58,272.00 |
| | ප්‍රතිපත්ති හා සැලසුම් | 2,174,154.74 | 187,301.03 |
| | අපනයන වෙළඳ ප්‍රවර්ධන | 28,192,265.75 | 23,588,115.27 |
| | සේවක වියදම් | 1,591,713.77 | 4,691,212.20 |
| | ප්‍රාදේශීය සංවර්ධන වියදම් | 22,153,559.34 | 15,407,405.25 |
| | වෙළඳ තොරතුරු හා සේවා වියදම් | 4,547,663.00 | 3,393,927.50 |

| | | |
|---|---|---|
| අන්තර්ජාල වියදම් | 949,206.61 | 3,156,929.74 |
| ඒකාබද්ධ කෘෂි ආදාර්ශ ව්‍යාපෘති | 10,019.00 | 1,572,934.50 |
| කාර්මික නිශ්පාදන සඳහා තත්ව සහතික | 227,932.40 | 1,433,834.60 |
| සෙස් ආපසු ගෙවීම් | - | 3,214,736.00 |
| HACCP ව්‍යාපෘතිය | - | 989,000.00 |
| | **234,406,882.33** | **332,186,795.04** |

## (6) පරිපාලන වියදම්

| | | |
|---|---|---|
| වැටුප් හා වේතන | 107,091,001.93 | 105,420,404.49 |
| අතිකාල හා නිවාඩු දීමනා | 8,653,737.90 | 9,293,537.09 |
| ප්‍රසාද දීමනා | 2,010,474.16 | 1,625,375.00 |
| සේවක අර්ථ සාධක අරමුදල | 12,941,816.19 | 12,580,954.56 |
| සේවක භාරකාර අරමුදල | 2,659,201.49 | 2,505,388.43 |
| විශ්‍රාම වැටුප් | - | 63,832.50 |
| පාරිතෝෂික දීමනා | 9,703,139.95 | 11,094,051.45 |
| සුභසාධන | 33,523,646.31 | 28,288,513.81 |
| බඳවාගැනීම් වියදම් | 41,050.80 | 732,766.57 |
| සේවක පිරිවැය | 6,007,785.90 | 1,221,539.00 |
| විදුලි ගාස්තු | 21,332,198.95 | 16,042,662.34 |
| ජල ගාස්තු | 664,796.13 | 3,997,691.46 |
| නීති හා වෙනත් වෘත්තීය ගාස්තු | 710,512.00 | 137,718.00 |
| ප්‍රචාරණය | 646,640.00 | 85,723.00 |
| ආරක්ෂක වියදම් | 3,729,341.14 | 5,075,444.81 |
| විගණන ගාස්තු | 600,000.00 | 632,500.00 |
| මුද්‍රණ වියදම් | 2,416,842.72 | 333,984.86 |
| ගමන් වියදම් | 1,086,696.00 | 980,769.50 |
| විනෝදාස්වාද | 351,401.20 | 358,721.55 |
| පොදු වියදම් | 1,086,174.39 | 1,672,861.07 |
| අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | 467,376.00 | 502,119.00 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 1,270,581.01 | 1,011,563.48 |
| ගෙවල් කුලී | 59,938,710.41 | 56,900,638.68 |
| ඉන්ධන හා තෙල් | 9,100,544.98 | 9,039,281.20 |
| වාහන නඩත්තු අලුත් වැඩියා | 5,093,439.67 | 5,281,513.94 |
| පුද්ගලික කුලී | 5,596,328.92 | 5,540,194.60 |
| සන්නිවේදන හා සාමාජික මුදල් | 7,906,128.08 | 9,583,189.94 |
| ක්ෂය අඳහා වෙන් කිරීම් | 10,059,460.91 | 15,911,661.87 |
| දේශීය පුහුණු වියදම් | 653,335.18 | 626,891.74 |
| කාර්යාල අවශ්‍යතා | 3,557,672.67 | 3,565,552.72 |
| ස්ථාවර වත්කම් විකණීමෙන් අලාභය | 1,199,008.83 | 2,484,150.00 |
| විදේශ පුහුණු වියදම් | 572,839.55 | 770,734.03 |
| විනිමය අනුපාත අලාභ | - | 140,961.19 |
| | **320,671,883.37** | **313,502,891.88** |

**(7) මූල්‍ය පිරිවැය**

| | | |
|---|---|---|
| පොලී වියදම් | 354,736.88 | 340,662.69 |
| මුද්දර ගාස්තු | 71,905.40 | 823,725.40 |
| මූල්‍ය වියදම් | 1,058,671.27 | 1,149,716.11 |
| | **1,485,313.55** | **2,314,104.20** |

## 8 මෝටර් රථ ප්‍රත්‍යාගණය

මණ්ඩලයට අයිති මෝටර් රථ ශ්‍රී ලංකා ඔටෝමොබයිල් සමාගම විසින් නැවත අගය කරන ලදි . වසර පහකට වරක් මෝටර් රථ වාහන නැවත අගය කිරීමට බලාපොරොත්තු වේ. මෝටර් රථ නැවත අගය නොකලේ නම් මෝටර් රථ ලියා හරින ලද වටිනාකම රු: 23,351,050 විය යුතුය.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**2013 .12.31. දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්**

**(9)** දේපල යන්ත්‍ර හා උපකරණ

**(9.1)** පිරිවැය

| වත්කම් | ශේෂය 01/01/2013 | එකතුකිරීම් | නැවත තක්සේරු කිරීම | ඉවත් කිරීම් | ශේෂය 31/12/2013 |
|---|---|---|---|---|---|
| ගෘහස්ත දුරකථන | 99,364.00 | - | - | - | 99,364.00 |
| මෝටර් රථ | 51,600,000.00 | - | | - | 51,600,000.00 |
| පරිගණක | 29,083,305.02 | 192,950.00 | - | 284,000.00 | 28,992,255.02 |
| පරිගණක මෘදුකාංග | 2,210,301.50 | 22,350.00 | - | - | 2,232,651.50 |
| පරිගණක උපකරණ | 401,260.30 | 61,946.01 | - | - | 463,206.31 |
| රූපවාහිනී උපකරණ | 4,730,855.01 | | - | - | 4,730,855.01 |
| පී.ඒ.බී.එක්ස් උපකරණ | 65,549.00 | | - | - | 65,549.00 |
| දුරකථන සවිකිරීම් | 1,456,660.14 | 24,980.00 | - | - | 1,481,640.14 |
| ලී බඩු හා කාර්යාල උපකරණ | 27,629,413.41 | 1,453,886.28 | - | 255,455.44 | 28,827,844.25 |
| | **117,276,708.38** | **1,756,112.29** | - | **539,455.44** | **118,493,365.23** |

**(9.2)** ක්ෂය වෙන්කිරීම්

| | ශේෂය 01/01/2013 | වර්ෂය සඳහා ක්ෂය | ඉවත් කිරීම් සඳහා ක්ෂය වෙන් කිරීම් | ශේෂය 31/12/2013 |
|---|---|---|---|---|
| ගෘහස්ත දුරකථන | 54,124.14 | 7,121.64 | - | 61,245.78 |
| මෝටර් රථ | - | 6,065,000.00 | - | 6,065,000.00 |
| පරිගණක | 19,833,418.35 | 2,103,736.99 | - | 21,937,155.34 |
| පරිගණක මෘදුකාංග | 1,491,260.44 | 248,897.41 | - | 1,740,157.85 |
| පරිගණක උපකරණ | 157,009.57 | 78,956.52 | - | 235,966.09 |
| රූපවාහිනී උපකරණ | 2,848,622.88 | 232,200.57 | - | 3,080,823.45 |
| පී.ඒ.බී.එක්ස් උපකරණ | 22,542.30 | 4,300.67 | - | 26,842.97 |
| දුරකතන සවිකිරීම් | 1,189,016.99 | 74,492.26 | - | 1,263,509.25 |
| ලී බඩු හා කාර්යාල උපකරණ | 13,673,210.87 | 1,244,754.85 | - | 14,917,965.72 |
| | **39,269,205.54** | **10,059,460.91** | - | **49,328,666.45** |

| ලියා හරින ලද වටිනාකම | 2013 | 2012 |
|---|---|---|
| පිරිවැය | 118,393,365.23 | 117176708.38 |
| සමුච්චිත ක්ෂය කිරීම් | (49,328,666.45) | (39,269,205.54) |
| ලියා හරින ලද වටිනාකම | **69,064,698.78** | **77,907,502.84** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය.**
**2013 .12.31 අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්**

| | | එස්,එල්.එෆ් ආර්.එස් 31.12.2013 Rs. Cts. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2012 Rs. Cts. |
|---|---|---|---|
| **(10)** | **ආශ්‍රිත සමාගම් ආයෝජන - ලයිස්තුගත නොවන.** | | |
| | ආශ්‍රිත සමාගම් ආයෝජන - ඩී.එච්.පී.එල්. | 805,459,768.00 | 339,120,793.00 |
| | | 805,459,768.00 | 339,120,793.00 |
| **(11)** | **වෙනත් නොවන වත්කම්** | | |
| | නිදහස් කළ හැකි වරනීය කොටස් | 105,058,083.78 | 105,058,083.78 |
| | සාමාන්‍ය කොටස් | 58,312,483.62 | 58,312,483.62 |
| | (-)හානිකරන සඳහා වෙන් කිරීම් | (122,822,417.40) | (122,822,417.40) |
| | | 40,548,150.00 | 40,548,150.00 |
| **(12)** | **තොගය** | | |
| | ලිපිද්‍රව්‍ය | 1,319,721.91 | 1,333,528.63 |
| | ටයර් හා ටියුබ් | 10,600.00 | 10,600.00 |
| | | 1,330,321.91 | 1,344,128.63 |
| **(13)** | **වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | |
| | අපනයන කරුවන්ගේ ණය | 46,413,543.87 | 46,486,856.35 |
| | (-)ණය ගැති හානිකරන වෙන් කිරීම් | (45,477,591.40) | (45,477,591.40) |
| | කාර්ය මණ්ඩල ණය | 47,487,670.34 | 43,656,656.57 |
| | (-)ගෙවිය යුතු සේවක පිරිවැය | (16,060,711.67) | (12,323,475.00) |
| | ලැබිය යුතු වැට් | 104,676,878.80 | 104,619,993.36 |
| | වෙනත් තැන්පතු | 13,197,964.24 | 13,256,823.46 |
| | | 150,237,754.18 | 150,219,263.34 |
| **(14)** | **අත්තිකාරම් හා ගෙවීම්** | | |
| | ගෙවීම් | 15,195,600.35 | 9,194,179.44 |
| | අත්තිකාරම් | 7,151,094.62 | 7,196,743.84 |
| | බැංකු සුරක්ෂිත | 300,000.00 | 300,000.00 |
| | සේවා තැන්පතු | 1,002,550.30 | 1,084,080.00 |
| | ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතු | 969,390.16 | 969,390.16 |
| | අවලංගු චෙක්පත් | 15,000.00 | 18,740.25 |
| | කලින් ගෙවූ කාර්ය මණ්ඩල වියදම් | 16,060,711.67 | 12,323,475.00 |
| | | 40,694,347.10 | 31,086,608.69 |

| | | |
|---|---|---|
| **(15)** **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව - මුදල් අයකැමි තැන්පත් | - | 6,166.68 |
| ලංකා බැංකුව - ලේක් වීව් | 15,067,165.78 | 1,760,202.35 |
| ජාතික සංවර්ධන බැංකුව | 62,406.51 | - |
| ලංකා බැංකුව - කෝපරේට් ශාඛාව | 1,638,984.99 | 121,361.45 |
| සම්පත් බැංකුව - නුවර | 4,259.89 | 3,860.01 |
| සම්පත් බැංකුව - ගාල්ල | 6,315.18 | 5,999.60 |
| ලංකා බැංකුව - අම්පාර | 2,712.19 | 2,093.67 |
| ලංකා බැංකුව - හම්බන්තොට | 1,756.50 | 1,434.01 |
| ලංකා බැංකුව - බදුල්ල | 3,066.15 | 2,249.52 |
| සම්පත් බැංකුව- කුරුණෑගල | 1,129.64 | 1,076.89 |
| අතැති මුදල් | 64,369.01 | 12,868.34 |
| | **16,852,165.84** | **1,917,312.52** |
| **(16)** **රජයේ ලැබීම්** | | |
| රජයේ දායකය | 7,904,002.00 | 7,904,002.00 |
| රජයේ දායකය මෝටර් රථ | 13,000,000.00 | 13,000,000.00 |
| යු.එන්.පී.ඩී දායකය | 2,110,282.00 | 2,110,282.00 |
| අයි.ටී.සී දායකය | 12,716.35 | 12,716.35 |
| අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය | 202,677.32 | 202,677.32 |
| (-)රජයේ ආධාර ක්‍රමක්ෂය | (2,523,657.46) | (1,180,578.73) |
| | **20,706,020.21** | **22,049,098.94** |
| **(17)** **වෙනත් වගකීම් හා වෙන්කිරීම්** | | |
| ණය ආධාර ක්‍රම දායකත්වය | 7,359,415.95 | 7,209,511.31 |
| ජාතික සවිය | - | 1,009,740.00 |
| ඌව පරණගම ආශ්‍රිත ගම්මාන | 2,108,251.77 | 2,108,251.77 |
| අපනයනකරු දායකත්වය | 15,959,129.16 | 14,921,692.60 |
| ඌව පරණගම පාලන ගිණුම | (10,403,683.00) | (10,403,683.00) |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 7,066,295.00 | 6,901,195.00 |
| | **22,089,408.88** | **21,746,707.68** |
| **(18)** **පාරිතෝෂික සඳහා වෙන් කිරීම්** | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 79,631,378.23 | 74,006,928.48 |
| වර්ෂය තුල කළ වෙන් කිරීම් | 9,703,139.95 | 11,096,137.75 |
| වර්ෂය තුල කළ ගෙවීම් | (9,379,441.91) | (5,471,688.00) |
| ඉදිරියට ගෙන ආ ශේෂය | **79,955,076.27** | **79,631,378.23** |
| **(19)** **වෙළඳ ගෙවියයුතු දෑ** | | |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 15,475.00 | 14,400.00 |
| ගෙවිය යුතු වැටුප් | 21,872.30 | 28,622.30 |
| ගෙවිය යුතු විවිධ වියදම් | - | 5,386.96 |
| ගෙවිය යුතු සේ. අ. අ. වියදම් | 1,662,418.28 | 1,689,582.90 |
| ගෙවිය යුතු සේ. හා. අ. වියදම් | 199,490.30 | 202,750.29 |

| | | |
|---|---|---|
| සේවක අවසාන ගෙවීම් | 61,714.46 | 64,244.46 |
| ගෙවිය යුතු යුතු විගණන ගාස්තු | 2,487,075.00 | 1,887,075.00 |
| නැවත ගෙවිය යුතු ආරක්ෂක තැන්පතු මුදල් අයකැමි | 2,500.00 | 6,166.68 |
| නැවත ගෙවිය යුතු තැන්පතු | 52,000.00 | - |
| ඉදිරිපත් නොකල චෙක්පත් | 1,051,078.05 | 1,021,281.00 |
| වෙනත් උපචිත වියදම් | 57,122,377.00 | 46,197,504.25 |
| කෘෂි කලාප ගෙවීම් ගෙවීම් අදහා වෙන් කිරීම් | 1,092,000.00 | 11,218,536.00 |
| | 63,768,000.39 | 62,335,549.84 |

**(20) බැංකු අයිරාව**

| | | |
|---|---|---|
| ලංකා බැංකුව - ලේක් වීව් | 17,148,432.07 | 55,093,612.35 |
| ලංකා බැංකුව - ගාල්ල | 648.88 | 648.88 |
| ජාතික සංවර්ධන බැංකුව | - | 795,842.30 |
| අවලංගු කළ චෙක්පත් | - | - |
| | 17,149,080.95 | 55,890,103.53 |

**(21) පෙර වර්ෂයේ ගැලපුම්**

අපනයන සංවර්ධන මණ්ඩලයේ කොටස් අයිතිය ඇති ඩී.එච්.පී.එල් සමාගමේ ගැලපුම් සැකසීම මෙහි පිළිබිඹු වේ.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත 39 ප්‍රකාරව හිමිකම් කොටස් ආයෝජනය හානිකරණ පරීක්ෂා කරන ලදී ඒ අනුව

**(22)** **(1)** 01.01.20011 දිනට හානිකරණ වෙන්කිරීම් නැවත ගැලපීම් රු 31,698,150 කි

**(2)** (2.1) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත 39 ට අනුව භාණ්ඩාගාරයෙන් ලද ප්‍රධාන රෙගු රැස්කිරීම් හානිකරන පරීක්ෂා කරන ලදි ඒ අනුව 01,01,2011 දිනට හානිකරන වෙන් කිරීම් රු 468,742,488.83 හඳුනාගන්නා ලදි.

(2.2) ශ්‍රී ලංකා ගණකාධිකරන ප්‍රමිත අංක 39 ට අනුව 01.01.2011 දිනට පැවති කාර්ය මණ්ඩල ණය පවත්නා පොලී අනුපාතයට අනුව හානිකරණ පාඩු අඩුකොට අවකරණය කරන ලදි. ඒ අනුව ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය සහ I.F.R.S ගැලපීම් අගය රු: 16,060,711.67ගිණුම්කරණ පොත්වල ගලපන ලදි.

ගැලපීම් ගිණුමේ ශේෂය කාර්ය මණ්ඩල ණය ගිණුමෙන් අඩුකරන ලදි. අනුව කාර්ය මණ්ඩල ණය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සාධාරණ අගයට පෙන්වා ඇත.

| | |
|---|---|
| කාර්ය මණ්ඩල ණය | 47,487,670.34 |
| I.F.R.S ගැලපීම් | (16,060,711.67) |
| | 31,426,958.67 |

**(2.2.1) ඉහත ගැලපීමෙන් හටගත් ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය ජංගම වත්කම් යටතේ පෙන්වා ඇත.**

| | |
|---|---|
| ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය. | 16,060,711.67 |

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 39 ට අනුව එක්ස්පෝ එකකයට ගෙවිය යුතු ශේෂය අවකරණය කරන ලදි. මෙය ඉහත ගැලපීමෙන් හටගත් බලපෑම පෙන්වයි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No.: විසී2/එෆ්/ඊඩීබී/1/13/27
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2014 දෙසැම්බර් 29 දින

සභාපති,

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2014 ජූලි 16 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 අනුව, මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සංසන්දනාත්මක සංඛ්‍යා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම අරමුණු කොටගෙන මණ්ඩලය හා සංවර්ධන බැංකුවක් සමඟ ඒකාබද්ධ වී සංස්ථාපිත පුද්ගලික සමාගමේ රු.1,439,656,910 ක් වූ රඳවා ගත් ලාභ මත පදනම්ව ආයෝජනයේ ධාරන වටිනාකම වැඩිවීම ලෙස දක්වා තිබූ රු.418,476,859 ක් ගිණුම්ගත කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාර අතීතානුයෝගී නැවත ප්‍රකාශ කිරීම ලෙස ගිණුම් ගත කරනු වෙනුවට පෙර වර්ෂ ගැලපීම් ලෙස සමාලෝචිත වර්ෂයේ සමුච්චිත ලාභයට ගලපා තිබුණි.

(ඇ) ශුන්‍ය ශුද්ධ අගයක් තිබූ සියලුම මෝටර් රථ 2012 දෙසැම්බර් 31 දිනාය වන විට ප්‍රත්‍යාගණනය කර තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 අනුව, ක්ෂය ප්‍රතිපාදන අනුපාතය ඵලදායී ජීවිත කාලය මත තීරණය විය යුතු වුවත්, ඊට පටහැනිව ක්ෂය අනුපාත 02 ක් එනම්, අවුරුදු 10 ට වැඩි මෝටර් රථ සඳහා සියයට 20 ක්ද, අවුරුදු 10 ට අඩු මෝටර් රථ සඳහා සියයට 10 ක්ද වශයෙන් ප්‍රත්‍යාගණනයට පෙර පැවති ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන දක්වා තිබුණි.

(ඈ) මණ්ඩලයට බාහිර පාර්ශවයන්ගෙන් ලැබී තිබූ ප්‍රදානවලින් මිලදී ගත් වත්කම් වෙන් වෙන්ව හඳුනා ගෙන නොතිබුණු අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 ප්‍රකාර එම වත්කම්වලට අදාළ ක්ෂය ප්‍රතිපාදනයට සමාන අගයක් ක්‍රමක්ෂය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඉ) අපනයනකරුවන්ට දී තිබුණු ණය මත ලැබිය යුතු පොළිය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36 ප්‍රකාර හානිකරණ ප්‍රතිපාදන සැලසිය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන තුළින් එවැනි ගිණුම්ගත කිරීමක් සිදු කර නොතිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති සටහන් අංක 2.18 මගින් අසම්භාව්‍ය බැරකම් පිළිබඳව දක්වා තිබුණද, 2012 හා 2013 වර්ෂවල ආයතනයට විරුද්ධව හා ආයතනය විසින් පවරා ඇති නඩු 06 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 ප්‍රකාර අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(උ) වරණීය කොටස් හා සාමාන්‍ය කොටස් ආයෝජනයන්හි අගය හීනවීම වෙනුවෙන් 2012 වර්ෂයේදී වෙන් කළ රු. 122,822,417 ක් වූ අගය 2013 වර්ෂයේදීද වෙන්කිරීම් ලෙස දක්වා තිබුණි. එහෙයින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ප්‍රකාර සමාලෝචිත වර්ෂයට අදාළ ආයෝජනවල හානිකරණය සමාලෝචනය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අනුග්‍රාහක හා වෙළඳ කුටි ආදායම් රු.3,180,000 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත් හැරී තිබුණි.

(ආ) නිලධාරියාගේ සේවා කාලය නිවැරදිව ගණනය කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වියදම රු.302,097 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂවලදී ගෙවා තිබූ එකතුව රු.5,324,516 ක් වූ අත්තිකාරම්වලට අදාළව සේවා හා සැපයුම් නිම කර තිබුණද, තවදුරටත් එම මුදල් අත්තිකාරම් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) වගකීම් හා වත්කම් ගිණුම් යටතේ දක්වා තිබූ පිළිවෙලින් එකතුව රු.11,079,248 ක් හා රු.622,595 ක් වූ අසාමාන්‍ය හර හා බැර ශේෂයන් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද අලාභ රු. 14,952 ක් අඩුවෙන්ද රු.14,952 ක් වූ වත්කම් විකුණුම් වැඩියෙන්ද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඊ) මුදල් සහ මුදල් හා සමාන දෑ වලට අයත් නොවූ පෙර වර්ෂ ගැලපීම් රු.418,476,859 ක්, ආශ්‍රිත සමාගමක අගය වැඩිවීම රු.47,862,116 ක් සහ එම ආශ්‍රිත සමාගමේ සමුච්චිත ලාභ ගැළපීම වූ රු.466,338,975 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය චලනයට බලපාන පරිදි දක්වා තිබුණි.

(උ) දුරකථන වියදම් රු.43,090 ක්, සංග්‍රහ වියදම් රු.2,020 ක්, වෛද්‍යාධාර වියදම් රු.9,900 ක් සහ නීති වියදම් රු.70,000 ක් වශයෙන් එකතුව රු.125,010 ක් ගොඩනැගිලි කුලී වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණු හෙයින් ගොඩනැගිලි කුලී ගිණුම එම අගයෙන් වැඩියෙන්ද, ඉහත එක් එක් ගිණුම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ඌ) 2013 නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා කුරුණෑගල පළාත් කාර්යාලය වෙනුවෙන් වූ ගෙවිය යුතු බදු කුළිය රු. 201,600 ක් උපචිත වියදම් ලෙස දක්වා නොතිබුණි.

4

(ඒ) පසුගිය වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දුන් ප්‍රත්‍යාගණන ලාභය රු.100,000 ක් වැඩියෙන් දැක්වීම, 2013 මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණ බැවින් එම අගයෙන් ප්‍රත්‍යාගණන ලාභය සහ දේපල, පිරියත හා උපකරණ වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට අපනයනකරුවන්ගෙන් අයවිය යුතු ශේෂය රු.5,878,112 ක් වුවත් උපලේඛන අනුව එය රු. 4,282,832 ක් වූයෙන් වෙනස රු.1,595,280 ක් විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) (i) ආයෝජන | 88,410,377 | කොටස් සහතික |
| (ii) සීඩබ්ලිව්ඊ හම්බන්තොට 2018 පුද්ගලික සමාගමේ කොටස්වල කළ ආයෝජන | 8,000,000 | අමාත්‍ය මණ්ඩල අනුමැතිය, මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය |
| (ආ) නොපියවූ අත්තිකාරම් | 5,324,516 | අත්තිකාරම් ලේඛන, කාල විශ්ලේෂණය |
| (ඇ) ඌව පරණගම අපනයන සැකසුම් ගම්මානය | 10,403,683 | ශේෂ සනාථ කිරීම සහ විස්තරාත්මක උප ලේඛන |

### 2.2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය, සිය මහනුවර ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය බැංකුවක් සතු ගොඩනැගිල්ලක් කල් බදු යටතේ ලබා ගැනීමට 2011 අගෝස්තු 01 දින එකී බැංකුව සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම අනුව, බදු ගිවිසුම් කාලය 2013 ජූලි 31 දින අවසන් වී තිබුණ අතර 2014 ජූලි 08 දින වන විටත් නැවත බදු කාලය දීර්ඝ කිරීමක් හෝ නව ගිවිසුමකට එළඹීමකින් තොරව 2013 අගෝස්තු 01 දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා බදු කුලී වශයෙන් රු. 841,000 ක් ගෙවා තිබුණි.

(ආ) ජාතික සවිය වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙවිය යුතු ලෙස දක්වා තිබූ රු. 1,009,740 ක් එම කාර්යාලයෙන් තහවුරු කර ගැනීමකින් තොරව සහ විධිමත් අනුමැතියකින් තොරව ආදායමට බැර කර තිබුණි.

## 2.3 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 2 (1) වගන්තිය | අපනයන සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික සංවර්ධන සභාව 1992 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වර්ෂ 21 ක කාලයක් ගත වී තිබුණද එකී සභාව පත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| XXIV වන පරිච්ඡේදයේ 3.5 වගන්තිය | මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව මාසික වැටුපෙන් සියයට 40 කට වැඩි නොවිය යුතු වුවත් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට යතුරු පැදි ණය හා ආපදා ණය දීමේදී මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව මාසික වැටුපෙන් සියයට 50 ක් ලෙස සලකා ලබාදී තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 104(1), 104(3), 104(4) සහ 110 | වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර අනතුර සිදුවූ දින සිට මාස 03 ක් ඇතුළත පරීක්ෂණ පවත්වා ඊට වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන යෝජිත විනයානුකූල ක්‍රියාමාර්ග ඇතුළත් පරිපූර්ණ වාර්තාවක් පරීක්ෂණ කමිටුව විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට ඉදිරිපත් කර නොතිබුණ අතර එම අනතුරු පිළිබඳ විස්තර ඇතුළත් හානි ලේඛනයක්ද පවත්වා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 165 | ආදායම් සඳහා මුදල්, චෙක්පත් හා අනෙකුත් ලැබීම් භාර ගැනීමේදී බලය පැවරූ නිලධාරියෙකුගේ සහතික කිරීමකින් තොරව ආදායම් එකතු කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 387 | චෙක්පත් මගින් කෙරෙන සියළුම ගෙවීම් සඳහා මුදල් පොතේ බැංකු ශේෂය ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා සැලකිලිමත් ලෙස පරීක්ෂාකාරී වීමකින් තොරව ගෙවීම් කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු අයිරාව රු.17,148,432 ක් විය. |
| (iv) | මුදල් රෙගුලාසි 388 | තැපෑලෙන් යවනු ලබන සියළුම චෙක්පත් පිළිබඳ විස්තර ඇතුළත් කර පවත්වාගෙන යනු ලබන ලේඛනය මුදල් රෙගුලාසි පරිදි විධිමත්ව පිළියෙල කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 396(ඇ) | චෙක්පතක් නිකුත් කළ දිනය හෝ එය වලංගු කළ දිනය යන දෙකින් පසුව එළඹෙන දින සිට මාස 06 කට වැඩි කාලයක් මුදල් නොකර තිබුණේ නම්, අදාළ ආදායකයාට ලිපි මගින් සිහිකැඳවීම් කර ඊටද ප්‍රතිචාරයක් නොමැති නම් අදාළ චෙක්පත් අවලංගු කළ යුතු වුවත් 2010 වර්ෂයේ සිට 2013 ජූනි 30 දින දක්වා රු. 1,051,078 ක් වූ ඉදිරිපත් නොකළ චෙක්පත් 45 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (vi) | මුදල් රෙගුලාසි 446(2) | ආදායම් හා වියදම් සඳහා බැංකු ජංගම ගිණුම් වෙන් වශයෙන් පවත්වා ගෙන යනු ලබන විට ශේෂ තුලනය කර ඉතිරි මුදල් ශේෂය ගණනය කිරීම සඳහා සාරාංශ ප්‍රධාන මුදල් පොත පවත්වාගත යුතු වුවත් එසේ පවත්වා නොතිබුණි. |
| (vii) | මුදල් රෙගුලාසි 1645 හා 1646 | මණ්ඩලය සතු වාහන 28 කට අදාළව වාහන ලොග් සටහන් පොත්, දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ අදාළ මාසය අවසන් වී ඊලඟ මාසයේ 15 වෙනි දිනට පෙර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (viii) | මුදල් රෙගුලාසි 1647(ඉ) | වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 03 වගන්තිය | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග වෙනුවෙන් වෙනම වත්කම් ලේඛනයක් පැවැත්විය යුතු වුවද, වටිනාකම රු.31,688,112 ක් වූ පරිගණක හා උපාංග වෙනුවෙන් එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඊ) | 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 756 හා 757 | නියමිත දින වකවානු තුළ මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි භාණ්ඩ සමීක්ෂණ සිදු කර වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) | 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන ජාතික අයවැය චක්‍රලේඛය | මණ්ඩලයට අවශ්‍ය වාහන මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගත යුතු වුවද, ඊට පටහැනිව වර්ෂ 05 ක කාලයක් සඳහා බදු කුලී පදනම මත වාහන 04 ක් ලබාගෙන 2013 දෙසැම්බර් 31 දින වන විට රු.10,051,179 ක් බදු කුලී වශයෙන් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඍ) 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 වගන්තිය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ට මාසිකව රු.5,500 ක ප්‍රවාහන දීමනාවක්ද, අනෙකුත් සේවකයින්ට දෛනිකව රු.164 ක උපරිමයකට යටත්ව ප්‍රවාහන දීමනාවක් ද ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබූ මුළු ප්‍රවාහන දීමනාව රු.5,004,963 ක් විය. |
| (එ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| (i) 5.2.3 ඡේදය | අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ එදිනට අයවැයගත ශේෂ පත්‍රයක් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 8.3.9 ඡේදය | මණ්ඩලයට අයත් වාහන 05 ක් සහ නිලධාරීන් 05 දෙනෙකු රේගිය අමාත්‍යාංශයේ සේවයට යොදවා තිබුණි. 2013 වර්ෂයේදී වාහන නඩත්තු වියදම් සහ කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස පිළිවෙලින් රු.3,204,138 ක් හා රු.899,195 ක් වශයෙන් එකතුව රු.4,103,333 ක් මණ්ඩලයේ අරමුදලින් වැයකර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.100,514,844 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.60,305,699 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.160,820,543 ක වාසිදායක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර එම වර්ධනය කෙරෙහි මුළු ආදායම් ලැබීම රු.69,380,831 කින් වැඩි වීම හා මුළු වියදම් රු.91,439,712 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) අපනයන ප්‍රවර්ධන සහ සංවර්ධන වැඩසටහන්

| අංශය | භෞතික කාර්යසාධනය | | | | | මූල්‍ය කාර්යසාධනය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කගත වැඩසටහන් ගණන | අවලංගු කළ හෝ අත්හිට වූ වැඩසටහන් ගණන | ප්‍රමාණවත් පරිදි සම්පූර්ණ නොකළ වැඩසටහන් ගණන | සම්පූර්ණ කළ වැඩසටහන් ගණන | කාර්ය සාධන ප්‍රතිශතය | අයවැයගත ප්‍රතිපාදනය | සත්‍ය මූල්‍ය උපයෝජනය | උපයෝජනයේ ප්‍රතිශතය |
| | | | | | සියයට | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| කාර්මික නිෂ්පාදන | 43 | 05 | 08 | 30 | 70 | 61.23 | 23.51 | 38 |
| කෘෂිකර්ම හා ධීවර නිෂ්පාදනය | 39 | 04 | 14 | 21 | 54 | 53.78 | 31.86 | 59 |
| අපනයන සේවා | 20 | 02 | 07 | 11 | 55 | 29.33 | 3.72 | 13 |
| අලෙවි සංවර්ධන | 42 | 01 | 07 | 34 | 81 | 64.98 | 40.48 | 62 |
| ප්‍රාදේශීය සංවර්ධන | 30 | 02 | 14 | 14 | 47 | 71.06 | 28.46 | 40 |
| අනෙකුත් අපනයන සේවා | 27 | - | 04 | 23 | 85 | 29.28 | 10.85 | 37 |
| විශේෂ ව්‍යාපෘති | 11 | 04 | 06 | 01 | 9 | 79.86 | 3.80 | 4.8 |
| අනෙකුත් | 02 | - | 02 | - | 0 | 115 | ඉදිරිපත් කර නොතිබුණි | 0 |
| එකතුව | 214 | 18 | 62 | 134 | 62 | 505.02 | 142.68 | 28 |

10

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබුණු වැඩසටහන් සංඛ්‍යාව 214 ක් වූ අතර ඉන් සම්පූර්ණ කර තිබුණේ වැඩසටහන් 134 ක් පමණි. ඒ අනුව භෞතික කාර්යසාධනයේ ප්‍රගතිය සියයට 62 ක් විය. මෙම වැඩසටහන සඳහා රු.මිලියන 505.02 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර ඉන් උපයෝජනය වී තිබුණේ රු.මිලියන 142.68 ක් හෙවත් සියයට 28 ක් පමණි.

(ii) ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන වාර්තා අනුව, ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට බලපෑ හේතු හඳුනා ගෙන නොතිබුණු අතර වැඩසටහන් කිහිපයකට ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදනය නොකිරීම නිසා ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට බලපෑ හේතු හඳුනා ගෙන නොතිබීමෙන් එම වැඩසටහන් නැවත ක්‍රියාත්මක කරනවාද නැද්ද යන්න පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි.

(ආ) විදේශ වෙළඳ ප්‍රදර්ශන

-------------------------

අපනයන ප්‍රවර්ධන වැඩසටහන් යටතේ 2008-2013 කාලපරිච්ඡේදය තුළදී විදේශ වෙළඳ ප්‍රදර්ශන 04 ක් සඳහා අපනයනකරුවන් 82 දෙනෙකු සහභාගි කරවා රු. මිලියන 65.38 ක් වැයකර තිබුණද අපනයන ප්‍රවර්ධනයට ඔවුන්ගෙන් දායක වී තිබුණේ අපනයනකරුවන් 25 දෙනෙකු පමණි. මේ අනුව අපනයන ආදායම වර්ධනය කිරීමෙහිලා, විදේශ වෙළඳපල ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගි කරවීම ඵලදායී අන්දමින් සිදු වී නොතිබුණි.

(ඇ) පාඨමාලා ප්‍රගතිය

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2009-2011 කාලපරිච්ඡේදය තුළදී ජාත්‍යන්තර වෙළඳාම් ක්‍රියාකාරී අංශ පිළිබඳ පාඨමාලාව හදාරන ලද ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවෙමින් පැවතියත් 2012 වර්ෂයේදී එම ප්‍රමාණය වැඩි වී තිබුණි. එසේ වුවත් 2009 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී සියයට 32 ක පිරිහීමක් සිදු වී තිබුණි. 2009 වර්ෂයේදී පාඨමාලා පැවත්වූ වාර ගණන 04 ක් වූ අතර 2013 වන විට එය එක් පාඨමාලාවක් දක්වා අඩු වී තිබුණි.

(ii) ඇඟළුම් ක්ෂේත්‍රයේ සේවයේ නියැලී සිටින කාර්යය මණ්ඩලයට පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් ලැබී තිබුණු පුහුණු වැඩසටහන් ආදායම රු. 207,500 ක් වුවද, ඒ සඳහා රු. මිලියන 1.04 ක් වැය කර තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී රු. මිලියන 156.6 ක් වැය කරමින් පැවැත්වූ ශ්‍රී ලංකා එක්ස්පෝ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයේ ඉලක්ක හා අරමුණු ඉටු කර ගැනීමට හැකියාවක් තිබේද යන්න, පෙර වෙළඳපල නිරීක්ෂණයන් මඟින් තහවුරු කර ගෙන නොතිබුණ අතර ප්‍රදර්ශනය පැවැත්වීමෙන් අනතුරුවද ප්‍රදර්ශනය පැවැත්වීමේ අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකිවූයේද යන්න පිළිබඳ ඇගයීමක් හෝ සමාලෝචනයක් 2013 වර්ෂයේදී කර නොතිබුණි.

(ආ) අම්පාර කෘෂි අපනයන නිෂ්පාදන කලාපයට රු. මිලියන 09 ක් වූ අන්නාසි මොරෙයියන් මිලියන 1.2 ක් සපයා ගැනීමට 2009 නොවැම්බර් 18 දින සැපයුම්කරුවකු සමඟ එළඹි ගිවිසුම අනුව, සියයට 50 ක අත්තිකාරම් මුදලක් සපයා තිබුණ අතර 2010 පෙබරවාරි 25 දින වන විට අන්නාසි මොරෙයියන් 86,250 ක් පමණක් සපයා තිබූ බැවින් ව්‍යාපෘති කටයුතු අඩාල වී තිබුණි. ඒ අනුව අදාළ ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණ අතර අත්තිකාරම් මුදලින් රු. 3,853,350 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. එසේම එහි වර්තමාන තත්ත්වය පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) ණය ලබා දී තිබුණු අපනයන සමාගම් 166 කින් සමාගම් 23 කට පමණක් එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව රු. 6,996,307 ක් වූ හිඟ ණය ශේෂයෙන් 2006 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළදී අයකර ගෙන තිබුණේ රු. 2,801,711 ක් පමණි. 2007 වර්ෂයෙන් පසු නෛතික ක්‍රියාමාර්ග මඟින් ණය අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කටයුතු ඉටු නොකිරීම නිසා, ණය අය වෙමින් පැවති අපනයන සමාගම් 23 න් 16 ක් ණය ගෙවීම පැහැර හැර තිබුණි. ඉතිරි සමාගම් අතරින් ණය ආපසු ගෙවීම පැහැර හරින ලද අපනයන සමාගම් 130 කින් අයවිය යුතු රු. 32,966,208 ක් වූ ණය අය කර ගැනීම සඳහා 2014 ජූනි 30 වන විටත් නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදි කිරීම අරමුණු කොටගෙන මණ්ඩලය, සංවර්ධන බැංකුවක් සමඟ ඒකාබද්ධව පෞද්ගලික සමාගමක් 1993 නොවැම්බර් 18 දින සංස්ථාපනය කර තිබුණි. මණ්ඩලය විසින් අදාළ සමාගමේ කොටස්වල කළ ආයෝජනය රු.161,088,760 ක් වූ අතර එය එම සමාගමේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 41.39 ක් විය. එසේ වුවද, 1996-2006 කාලපරිච්ඡේදය තුළදී ලාභාංශ ගෙවීමට ප්‍රමාණවත් ලාභ අදාළ සමාගම උපයාගෙන තිබුණද ආයෝජන සඳහා ප්‍රතිලාභ මණ්ඩලයට ලබා දී නොතිබුණි.

(ඉ) සමාගම් 30 ක වරණීය කොටස්හි කළ රු. 105,058,084 ක් වූ ආයෝජන සඳහා 1997–2013 කාලපරිච්ඡේදයට සහ සමාගම් 31 ක සාමාන්‍ය කොටස්වල කළ රු.43,494,334 ක් වූ ආයෝජන සඳහා 2001-2013 කාලපරිච්ඡේදයට අදාළව ලාභාංශ ලැබී නොතිබුණි.

(ඊ) ඉන්දියාවේ චෙන්නායි නුවර 2004-2009 කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබූ ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳසැල් 05 කින් අය විය යුතු හිඟ කුලී හා විදුලි ගාස්තු රු.7,049,858 ක් 2014 ජූනි 30 වන විටත් අය කර ගෙන නොතිබුණි.

(උ) අපනයන සමාගම්වල මූල්‍ය ශක්තිය වැඩි දියුණු කර අපනයන වර්ධනය තුළින් ඉහළ අපනයන ආදායමක් ලබා ගැනීමේ අරමුණ ඇතිව 1983-1999 කාලපරිච්ඡේදය තුළ ආරම්භ කළ ණය වැඩසටහනක් යටතේ අපනයන සමාගම් 331 කට ණය ලබාදී තිබුණි. එයින් සමාගම් 166 ක් සඳහා ලබා දී තිබූ රු.59,659,978 ක් වූ ණය මුදලින් රු.46,413,543 ක් අය කරගෙන නොතිබුණි.

**4.3 මතභේදයට තුඩු දෙන ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12 වගන්තියේ දැක්වෙන මණ්ඩලයේ කාර්යයන්වලින් බැහැරව හා අංක පීඊඩී 12 හා 2003 ජූනි 02 දිනැති යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 ඡේදය ප්‍රකාර මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ලබා ගැනීමේ කටයුතු සංවිධානය, ක්‍රීඩා කටයුතු සංවර්ධනය හා ප්‍රවර්ධනය උදෙසා 2011 වර්ෂයේ පිහිටුවා තිබුණු එක් පෞද්ගලික සමාගමක කොටස් මිලදී ගැනීම වෙනුවෙන් රු. මිලියන 8 ක් ආයෝජනය කර තිබුණි. කෙසේ වෙතත්, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ලංකාවට නොලැබීම මත 2013 දෙසැම්බර් 31 දින වනවිටත් මෙම සමාගමේ කටයුතු අක්‍රීය වී තිබුණි.

(ආ) පුහුණු කටයුතු සඳහා මණ්ඩලයේ ඉඩ පහසුකම් තිබියදීත්, එය නොසලකා අයදුම්කරුවන් 45 කට ආසන්න සංඛ්‍යාවක් සහභාගි වූ එක් පාඨමාලාවක් බාහිර ආයතනයක පැවැත්වීම වෙනුවෙන් 2011– 2013 කාල පරිච්ඡේදය තුළදී රු.602,274 ක් වැය කර තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක මණ්ඩල වර්ගීකරණය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| තෘතියික | 65 | 54 | 11 |
| ද්විතියික | 128 | 85 | 43 |
| ප්‍රාථමික | 75 | 61 | 14 |
| කොන්ත්‍රාත් | -- | 13 | -- |
| එකතුව | 268 | 213 | 68 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද 2010 අගෝස්තු 13 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/30/4/200/2 දරන ලිපියේ 11 ඡේදය අනුව, තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 6.1.5 වගන්තිය ප්‍රකාරව, සහකාර අධ්‍යක්ෂ (සාමාන්‍ය), සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ), සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) සහ සහකාර අධ්‍යක්ෂ (මුදල්) යන තනතුරු සඳහා වූ බඳවාගැනීම් හා උසස් කිරීම් අනුමත බඳවා ගැනීම් පරිපාටියකින් තොරව සිදු කර තිබුණි.

(ඇ) බඳවා ගැනීමේ පරිපාටිය අනුව, අදාළ තනතුරට අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්ද සැලකිල්ලට ගත යුතු වුවත් එම සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරියෙකු සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුර සඳහා බඳවා ගෙන තිබුණි.

(ඇ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාර විධිමත් අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 13 දෙනෙකු බඳවා ගෙන වැටුප් හා දීමනා වශයෙන් රු. 5,420,465 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

2009 ජූනි 09 දිනැති අංක ඩීඑමඒ/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ වගන්ති 07 සහ 09 අනුව අභ්‍යන්තර විගණන වැඩසටහන් සහ විගණන සැලැස්ම සකස් කර නොතිබුණ අතර, විගණන කටයුතු ක්‍රියාත්මක කිරීම දුර්වල තත්ත්වයක පැවතිණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේදී විගණන විමසුම් 04 ක් නිකුත් කර තිබුණද එම විමසුම්වලින් වාර්තා කර තිබුණු අඩුපාඩු සම්බන්ධයෙන් ද මණ්ඩලයේ අවධානය යොමුකර නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති නමුත්, ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහත දැක්වේ.

| 2012 වර්ෂයේ විගණන ඡේදයට යොමුව | විගණන ඡේදයේ සාරාංශය |
|---|---|
| 2.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු | 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතට පටහැනිව පත් කර තිබූ විධායක අධ්‍යක්ෂවරයෙකුට 2012 දෙසැම්බර් 31 දිනට මාසික දීමනා, ඉන්ධන දීමනා හා දුරකථන ගාස්තු වශයෙන් එකතුව රු. 1,557,337 ක් මණ්ඩලයේ අරමුදලින් ගෙවා තිබුණි. |
| 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා (ඇ) | ඌව පරණගම හරිතාගාර ව්‍යාපෘතිය යටතේ ගිවිසුම් ගත කොන්දේසි පරිදි හරිතාගාර 100 ඉදිකිරීම සඳහා ඌව පරණගම ගොවීන්ට ගෙවූ රු.මිලියන 5 ක් වූ ණය මුදල් ගොවීන්ගෙන් ආපසු අයකර ගෙන මහා භාණ්ඩාගාරයට ගෙවීමේ වගකීම මණ්ඩලයට පැවරී තිබුණද එම වගකීම මණ්ඩලය ඉටුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| 4.3 | හඳුනාගත් පාඩු | හම්බන්තොට බටඅත කර්මාන්ත වැඩසටහනේ සම්භාණ්ඩ කර්මාන්ත ව්‍යාපෘතිය සඳහා රු. 1,000,000 ක් ආයෝජනය කර ස්ථාපිත කළ පුද්ගලික සමාගමේ කටයුතු ආරම්භ කිරීම අත්හැර දමා තිබුණු බැවින්, ආයෝජනය කළ මුදල් මණ්ඩලයට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ .

(අ) අයවැය ලේඛනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආයෝජන
(ඈ) ණය ආපසු අයකර ගැනීම
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) වෙළඳ ප්‍රදර්ශන

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)